# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 14 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ

II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් [illegible] ගත හැකි ය.

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 14 වැනි දින]

එල්. ඩී.– ඕ. 61/87.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

කෙටි නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව " යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(අ) ඒ ව්‍යවස්ථාව ඒ ව්‍යවස්ථාවේම (1) වන අනුව්‍යවස්ථාව ලෙස යළි අංක කිරීමෙන්;

(ආ) එකී (1) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථා, එකතු කිරීමෙන් :–

" (2) දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වන්නේ ය.

(3) ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව වන්නේ ය.

(4) මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීති මගින් විධිවිධාන සැලැස්විය යුතු ය."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 138 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(අ) "යම්කිසි මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින්" යන වචන වෙනුවට " මහාධිකරණයේ අභියාචනා අධිකරණ බලය හෝ මුල් අවස්ථා අධිකරණ බලය හෝ ක්‍රියාත්මක කිරීමෙහි දී ඒ අධිකරණය විසින් හෝ යම්කිසි මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "ඒ මුල් අවස්ථා අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ වෙනත් ආයතනය විසින් " යන වචන වෙනුවට " ඒ මහාධිකරණය විසින් හෝ ඒ මුල් අවස්ථා අධිකරණය, විනිශ්චය අධිකාරය වෙනත් ආයතනය විසින් හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

4. මෙහි පහත දැක්වෙන පරිච්ඡේදය සහ ව්‍යවස්ථා 154 වන ව්‍යවස්ථාවෙන් ඉක්බිතිව ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය ලෙස සහ 154අ සිට 154ඩ දක්වා වූ ව්‍යවස්ථා ලෙස බලපවත්වන්නේ ය:–

"XVIIඅ පරිච්ඡේදය

පළාත් සභා පිහිටුවීම.

154අ. (1) ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරන දිනයේ හෝ දිනවල සිට ක්‍රියාත්මක වන පරිදි අටවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් සෑම පළාතක්ම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විධිවිධානවලට යටත්ව, පළාත් සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ. වෙනස් වෙනස් පළාත් සඳහා වෙනස් වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකිය. :–

(2) (1) වන අනුව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම පළාත් සභාවක් ම, පළාත් සභා ඡන්ද විමසීම් වලට අදළ නීතියට අනුකූලව, එම සභාවේ මන්ත්‍රීවරුන් තෝරා පත්කරගනු ලැබූ විට සංස්ථාපනය විය යුතු ය.

(3) මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ විධිවිධානයන්හි පටහැනිව කුමක් සඳහන් වුව ද, එකිනෙකට යාබද පළාත් දෙකකට හෝ තුනකට එක් ආණ්ඩුකාරවරයෙකුගෙන්, එක් ප්‍රධාන අමාත්‍යවරයෙකුගෙන්, එක් අමාත්‍ය මණ්ඩලයකින් සහ තෝරා පත්කරගන්නා ලද එක් පළාත් සභාවකින් යුත්, එක් පරිපාලන ඒකකයක් බවට පත්වීමටද එකී පළාත් එක් පරිපාලන ඒකකයක් වශයෙන් පරිපාලනය කරනු ලැබීම දිගටම පවත්වාගෙන යා යුතු ද නැතහොත් ඒ එක් එක් පළාත් වෙනම ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් සහිතව ස්වකීයමය වූ පළාත් සභාවක් ඇති වෙනම පරිපාලන ඒකකයක් වශයෙන් සකස්විය යුතු ද යන්න නිශ්චය කිරීමේ ආකාරය පිළිබඳව ද විධිවිධාන පාර්ලිමේන්තුව විසින් යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ සෑදිය හැක්කේ ය.

ආණ්ඩුකාරවරයා.

154ආ. (1) 154අ වන ව්‍යවස්ථාවට අනුකූලව පළාත් සභාවක් පිහිටුවනු ලැබ ඇති සෑම පළාතක් සඳහා ම ආණ්ඩුකාරවරයකු සිටිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් ආණ්ඩුකාරවරයා පත්කරනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයාගේ ප්‍රසාදය ඇති තාක්කල් 4 (ආ) වන ව්‍යවස්ථාවට අනුකූලව ඔහු විසින් ධුරය දැරිය යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා වෙත යවන ලද ලිපියක් මගින් ආණ්ඩුකාරවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.

(4) (අ) (i) ආණ්ඩුකාරවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන චේතනාන්විතව උල්ලංඝනය කර තිබීම;

(ii) ආණ්ඩුකාරවරයා ස්වකීය ධුරයේ බලතල අයුතු අන්දමින් පාවිච්චි කිරීම හා සම්බන්ධ විෂමාචාරය හෝ දූෂණය හා සම්බන්ධ වරද සිදුකර තිබීම;

(iii) ආණ්ඩුකාරවරයා අල්ලස සම්බන්ධ වරදක් හෝ චරිත දූෂණය හා සම්බන්ධ වරදක් සිදුකර තිබීම.

යන හේතු මත ආණ්ඩුකාරවරයා ඉවත් කරන ලෙසට ජනාධිපතිවරයාට උපදෙස් දෙන යෝජනාවක්, එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පළාත් සභාවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් සම්මත කරනු ලැබිණි නම්, පළාත් සභාව විසින් (ආ) ඡේදයට යටත්ව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් හේතු මත ආණ්ඩුකාරවරයා ඉවත් කරන ලෙසට ජනාධිපතිවරයාට උපදෙස් දෙන යෝජනාවක්, ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් ඒ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පළාත් සභාවේ පැමිණ සිටින මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් දෙකෙන් කොටසකට නොඅඩු සංඛ්‍යාවක් විසින් අත්සන් කරනු ලැබ ඇත්නම් මිස, පළාත් සභාවේ සභාපතිවරයා විසින් භාරගැනීම හෝ ඒ යෝජනා සම්මතය ගැන පළාත් සභාවේ දී සාකච්ඡා කිරීම හෝ නොකළ යුත්තේ ය.

(5) ආණ්ඩුකාරවරයා විසින් ස්වකීය ධුරය භාරගත් දින සිට අවුරුදු පහක කාලසීමාවක් මේ ව්‍යවස්ථාවේ පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුත්තේ ය.

(6) ආණ්ඩුකාරවරයා ලෙස පත්කරනු ලබන සෑම තැනැත්තෙක්ම ජනාධිපතිවරයා ඉදිරිපිට දී හතරවන උපලේඛනයේ දක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තැබීමෙන් හෝ දිවුරුම දී ඊට අත්සන් තැබීමෙන් හෝ ධුරය භාරගත යුත්තේ ය.

(7) එසේ ධුරය භාරගත් විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇතිකරන ලද හෝ පිළිගන්නා ලද වෙනත් යම් ධුරයක් ආණ්ඩුකාරයෙකු විසින් දැරීම අවසාන වන අතර ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් පාර්ලිමේන්තුවේ සිය අසුනින් ඉවත් විය යුත්තේ ය. ආණ්ඩුකාරවරයා විසින් වෙනත් කවර වූ හෝ ලාභදායී ධුරයක් හෝ තනතුරක් නොදැරිය යුත්තේ ය.

(8) (අ) සුදුසු යැයි ආණ්ඩුකාරයා අදහස් කරන වේලාවක දී සහ ස්ථානයක දී රැස්වීම සඳහා ඔහු විසින් කලින් කල පළාත් සභාව කැඳවිය හැක්කේ ය. එහෙත් එක් සභා වාරයක අවසාන රැස්වීම සහ ඊළඟ සභාවාරයේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරන ලද දිනය අතර කාලය මාස දෙකකට අඩුවිය යුත්තේ ය.

(ආ) ආණ්ඩුකාරවරයා විසින් කලින් කල පළාත් සභාවේ වාරාවසානය කළ හැක්කේ ය.

(ඇ) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාව විසුරුවා හැරිය හැක්කේ ය.

(ඈ) ආණ්ඩුකාරවරයාගේ මතය අනුව, පළාත් සභාවේ මන්ත්‍රීවරයන් බහුතර සංඛ්‍යාවක සහයෝගය අමාත්‍ය මණ්ඩලයට ඇති තාක් කල්, ආණ්ඩුකාරවරයා විසින් මේ අනුව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල, ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(9) 34 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතලවලට හානියක් නොමැතිව, සහ ඔහුගේ විධානයට යටත්ව පළාතක ආණ්ඩුකාරවරයාට ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් සාදන ලද ප්‍රඥප්තියකට එරෙහිව හෝ පළාත් සභාවට ප්‍රඥප්ති සෑදීමට බලය ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියකට එරෙහිව වූ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තෙකුට ම සමාවක් දීමේ සහ එවැනි යම් තැනැත්තකුට අධිකරණය විසින් නියම කරන ලද දඬුවමක් ක්‍රියාත්මක කිරීම කල් තැබීමේ හෝ එම දඬුවම ලිහිල් කිරීමේ බලය ඇත්තේ ය;

එසේ වුව ද, යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට ආණ්ඩුකාරවරයා එකඟ නොවන්නා වූ ද එම කාරණය, ආඥාවක් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයා වෙත යොමු කිරීම මහජන යහපත පිණිස අවශ්‍ය වන්නේ යැයි ආණ්ඩුකාරවරයා සලකන්නා වූ ද අවස්ථාවක ඔහු විසින් ඒ කාරණය ජනාධිපතිවරයා වෙත යොමු කළ හැක්කේ ය.

(10) (අ) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාව අමතනු ලැබිය හැකි අතර එම කාර්යය සඳහා මන්ත්‍රීවරුන්ට පැමිණෙන ලෙස ද නියම කළ හැක්කේ ය.

(ආ) තත් කාලයෙහි සභාවේ සැලැකිල්ලට භාජනව පවතින ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් හෝ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් හෝ ආණ්ඩුකාරවරයා විසින් සභාව වෙත පණිවිඩ යැවීම් කළ හැකි අතර එවැනි පණිවිඩයක් යවනු ලැබූ විට සැලකිල්ලට ගත යුතු ලෙස එම පණිවුඩයෙන් නියම කර ඇති යම් කාරණයක් සභාව විසින් හැකි තරම් ඉක්මනින් සැලකිල්ලට ගත යුත්තේ ය.

(11) (අ) යම් පළාතක කටයුතු පරිපාලනයට සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යොජනා සම්බන්ධ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සියලුම තීරණ, ඒ පළාතේ ආණ්ඩුකාරවරයාට දැනුම් දීම;

(ආ) යම් පළාතක කටයුතු පරිපාලනයට සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනාවලට අදාළව ආණ්ඩුකාරවරයා විසින් ඉල්ලනු ලබන තොරතුරු, ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) අමාත්‍යවරයකු විසින් තීරණයක් ගනු ලැබ ඇත්තා වූ ද එහෙත් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලනු ලැබ නොමැත්තා වූ ද යම් කාරණයක් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලනු ලැබීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලැබුවහොත් එසේ ඉදිරිපත් කිරීම

ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(12) ආණ්ඩුකාර ධුරය දරන තැනැත්තන්ගේ වැටුප, දීමනා, විශ්‍රාම ගැනීමේ වයස සහ විශ්‍රාම විශ්‍රාම වැටුප් හිමිකම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් විධි විධාන සැලැස්විය යුත්තේ ය.

ආණ්ඩුකාර වරයා විසින් විධායක බලකල ක්‍රියාත්මක කිරීම.

154ඈ. පළාත් සභාවක් විසින් ප්‍රඥප්ති සම්පාදනය කරනු ලැබිය හැකි කාරණාවලට ව්‍යාප්ත වන විධායක බලය එම පළාත් සභාව විසින් පිහිටවනු ලැබූ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් 154 ඊ ව්‍යවස්ථාවට අනුකූලව, කෙළින්ම හෝ පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් මාර්ගයෙන් හෝ සිය යටත් නිලධරයින් මාර්ගයෙන් හෝ ක්‍රියාත්මක කළ හැක්කේ ය.

පළාත් සභාවේ සාමාජිකත්වය.

154ඇ. (1) පළාත් සභාවක්, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති පළාතේ වර්ග ප්‍රමාණය සහ ජනගහනය සැලකිල්ලට ගෙන, නීතියෙන් තීරණය කරනු ලබන පරිදි වූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය.

(2) (අ) පළාත් සභාවක් පිහිටුවනු ලැබ ඇති පළාත ඇතුළත සීමාවන් පිහිටුවා ඇති මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කරගනු ලැබ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවයන්ට එම පළාත් සභාවේ රැස්වීම් කටයුතුවලට සහභාගිවීමේ අයිතිවාසිකම දීමට ඒ සභාව විසින් පළාත් සභාවේ එම මන්ත්‍රීවරයන්ගේ ධුර කාලය ආරම්භ වන අවස්ථාවේ දී යෝජනා සම්මතයක් මගින් තීරණය කළ හැක්කේ ය.

(ආ) (අ) ඡේදය යටතේ කරන ලද යෝජනා සම්මතයක් බල පවත්නාතාක් කල්, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති පළාත ඇතුළත සීමාවන් පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත්කර ගනු ලැබ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, එම සභාවේ ධුරකාලය ඇතුළත, එම පළාත් සභාවේ රැස්වීම් කටයුතුවල දී කතා කිරීමට, සහ වෙනත් ආකාරයකින් සහභාගිවීමට ද එම පළාත් සභාවේ යම් කාරක සභාවක සාමාජිකයෙකු වශයෙන් ඔහු නම් කරනු ලැබූ විටෙක, ඒ කාරක සභාවේ දී කථා කිරීමට සහ වෙනත් ආකාරයකින් සහභාගී වීමට ද අයිතිවාසිකම ඇත්තේ ය. නමුත් පළාත් සභාවක දී හෝ එහි කාරක සභාවක දී ඡන්දය දීමට හිමිකම් ඇත්තේ (අ) ඡේදය යටතේ වූ යෝජනා සම්මතයෙහි ඒ සඳහා විධිවිධාන ඇත්නම් පමණි.

(ඇ) මේ අනුව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මකවීම පළමුවන පාර්ලිමේන්තුව විසිරුවා හරිනු ලබන දිනයෙහි අවසානය වන්නේ ය.

ධුර කාලය.

154ඉ. පළාත් සභාවක් කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, එම පළාත් සභාවේ පළමු රැස්වීම සඳහා නියම කරන ලද දින සිට අවුරුදු පහක කාලයක් ඒ සභාව පවත්නේ ය. එකී පස් අවුරුදු කාලය ඉකුත්ව ගිය විට එම පළාත් සභාව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය.

අමාත්‍ය මණ්ඩලය.

154ඊ. (1) යම් පළාතක ආණ්ඩුකාරවරයාට ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහායවීම සහ උපදෙස් දීම පිණිස ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙනත් අමාත්‍යවරයන් හතර දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ පළාත් අමාත්‍ය මණ්ඩලයක් තිබිය යුත්තේ ය. ආණ්ඩුකාරවරයා විසින් තම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් තම අභිමතය අනුව ඉටු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ යටතේ හෝ නියම කරනු ලැබ ඇති තාක් දුරට හැර, ආණ්ඩුකාරවරයා විසින් එම උපදෙස්වලට අනුකූලව තම කර්තව්‍ය ඉටු කළ යුත්තේ ය.

(2) යම් කාරණයක් ආණ්ඩුකාරවරයා විසින් තම අභිමතය අනුව ඉටුකළ යුතු කාරණයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ යටතේ හෝ නියම කරනු ලැබ තිබේ ද නැද්ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ආණ්ඩුකාරවරයා විසින් ඒ සම්බන්ධයෙන් තම අභිමතය අනුව කරනු ලබන තීරණය අවසනාත්මක වන අතර ආණ්ඩුකාරවරයා විසින් කරන ලද යම් ක්‍රියාවක වලංගුභාවය ගැන, ඔහු විසින් තම අභිමතය අනුව ක්‍රියා කළ යුතුව තිබිණි යැයි හෝ නොතිබිණයැයි යන හේතුව මත, කිසි අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. ආණ්ඩුකාරවරයාගේ අභිමතය ක්‍රියාත්මක කිරීම ජනාධිපතිවරයාගේ විධානය මත විය යුත්තේ ය.

(3) අමාත්‍යවරයන් විසින් ආණ්ඩුකාරවරයාට යම් උපදේශයක් දෙන ලද්දේ ද, එසේනම් ඒ කවර උපදේශයක් වී ද යන්න සම්බන්ධයෙන් කිසිම අධිකරණයක දී විභාග කරනු නොලැබිය යුත්තේ ය.

(4) පළාතක් සඳහා සංස්ථාපිත පළාත් සභාවේ යම් කිසි මන්ත්‍රීවරයෙකු ඒ පළාත් සභාවේ බහුතර මන්ත්‍රීවරයන්ගේ සහනය ලබා ගැනීමට සමත් වන්නේ යැයි ආණ්ඩුකාරවරයා කල්පනා කෙරේ ද ආණ්ඩුකාරවරයා විසින් ඒ මන්ත්‍රීවරයා ප්‍රධාන අමාත්‍ය ධුරයට පත් කළ යුත්තේ ය :

එසේ වුව ද, පළාත් සභාවකට තෝරාපත්කර ගනු ලැබ ඇති මන්ත්‍රීවරුන්ගෙන් දෙකෙන් එකකට වැඩි සංඛ්‍යාවක් එක් දේශපාලන පක්ෂයකට අයත් සමාජිකයන් වන අවස්ථාවක, ආණ්ඩුකාරවරයා විසින් එම සභාවේ එම දේශපාලන පක්ෂයේ නායකයා ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් පත් කළ යුත්තේ ය.

(5) ආණ්ඩුකාරවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශය අනුව, සෙසු අමාත්‍යවරයන් එම පළාත සඳහා සංස්ථාපනය කර ඇති පළාත් සභාවේ මන්ත්‍රීවරයන් අතරින් පත් කළ යුත්තේ ය.

(6) පළාත් අමාත්‍ය මණ්ඩලය පළාත් සභාවට සාමූහිකව වග කීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(7) ප්‍රධාන අමාත්‍ය ධුරයට හෝ පළාත් අමාත්‍ය මණ්ඩලයේ සමාජිකයෙකු වශයෙන් හෝ පත්කරන ලද තැනැත්තෙක්, හතරවන උපලේඛනයේ දක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ඔහුගේ ධුරයේ කාර්ය ආරම්භ නොකළ යුත්තේ ය.

පළාත් සභා ප්‍රඥප්ති.

**154ඡ.** (1) සෑම පළාත් සභාවක් ම විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති ප්‍රදේශයට අදාළ වන සේ (මෙහි මින්මතු "පළාත් සභා ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන හෝ නවවන උපලේඛනය හෝ සංශෝධනය කිරීම සඳහා හෝ ඉවත් කිරීම සඳහා වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව යොමු කිරීමෙහි නිශ්චය කොට දක්වෙන කාල සීමාවක් ඇතුළත, අදහස් ප්‍රකාශ කිරීම පිණිස, ජනාධිපතිවරයා විසින්, සෑම පළාත් සභාවක් වෙතම යොමුකරනු ලැබ ඇත්නම් මිස, සහ -

(අ) ඒ සෑම සභාවක් ම එම සංශෝධනයට හෝ ඉවත් කිරීමට හෝ එකඟ වන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිණි නම් ; හෝ

(ආ) සංශෝධනය හෝ ඉවත් කිරීම හෝ පිළිබඳව එක් සභාවක් හෝ සභා වැඩි ගණනක් එකඟ නොවන්නා වූ අවස්ථාවක, එම පණත් කෙටුම්පත 82 වන ව්‍යවස්ථාවේ නියම කර ඇති විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබිණි නම්

මිස, ඒ පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය.

(3) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් පිළිබඳව වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව යොමු කිරීමෙහි නිශ්චය කොට දක්වෙන කාලසීමාවක් ඇතුළත, අදහස් ප්‍රකාශ කිරීම පිණිස, ජනාධිපතිවරයා විසින්, සෑම පළාත් සභාවක් වෙතම යොමු කරනු ලැබ ඇත්නම් මිස, සහ

(අ) ඒ සෑම සභාවක් ම එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වන්නා වූ අවස්ථාවක, එම පණත් කෙටුම්පත, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිණි නම්; හෝ

(ආ) පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ සභාවක් හෝ සභා වැඩි ගණනක් එකඟ නොවන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත 82 වන ව්‍යවස්ථාවේ නියම කර ඇති විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබිණි නම්

මිස නීතියක් බවට පත් නොවන්නේ ය :

එසේ වුව ද, එවැනි යොමු කිරීමක් කරන ලදුව සියලුම පළාත් සභා නොව පළාත් සභා සමහරක් පමණක් එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වූ අවස්ථාවක, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් එම පනත් කෙටුම්පත සම්මත කරනු ලැබූ විට, එම පනත් කෙටුම්පත, ඊට එකඟ වූ පළාත් සභා පිහිටුවනු ලැබ ඇත්තේ යම් පළාත් සඳහා ද ඒ පළාත් සම්බන්ධයෙන් පමණක් අදාළවන නීතියක් බවට පත්වන්නේ ය.

(4) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නීති සාදන ලෙස පළාත් සභා එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින ලද අවස්ථාවක, ඒ පළාත් සභා පිහිටුවනු ලැබ ඇත්තේ යම් පළාත් සඳහා ද ඒ පළාත්වලට පමණක් අදාළ වන සේ පාර්ලිමේන්තුව විසින්, පැමිණ ඡන්දය දෙන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන්, එම කාරණය සම්බන්ධයෙන් නීති සෑදිය හැක්කේ ය.

(5) (අ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යැයි පාර්ලිමේන්තුව අදහස් කරන ආකාරයට සියලුම පළාත් සභා විමසීමෙන් පසුව (මෙහි මින් මතු "සමගාමී ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නවවන උපලේඛනයේ III වන ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නීති පැනවිය හැක්කේ ය.

(ආ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යැයි පළාත් සභාව අදහස් කරන ආකාරයට පාර්ලිමේන්තුව විමසීමෙන් පසුව, එම පළාත් සභාව පිහිටුවනු ලැබූ පළාතට අදාළ වන සේ සමගාමී ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පළාත් සභාවක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(6) පළාත් සභාවක් විසින් සම්පාදනය කරන ලද යම් ප්‍රඥප්තියක යම් විධිවිධානයක් මේ ව්‍යවස්ථාවේ පෙරාකුව වූ විධිවිධානවලට අනුකූලව සම්පාදනය කරන ලද යම් නීතියක විධිවිධානවලට අනනුකූල වන අවස්ථාවක, එම නීතියේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, එම ප්‍රඥප්තියේ විධිවිධාන, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට බලරහිත වන්නේය.

(7) (මෙහි මින්මතු "සංවෘත ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නව වන උපලේඛනයේ II වන ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමට පළාත් සභාවකට බලය නොමැත්තේ ය.

(8) පළාත් සභා ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මේ පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව එම නීතියට අනනුකූල බව දීර්ඝ නාමයේ විස්තර කරනු ලැබ ඇති ප්‍රඥප්තියක් එම කාරණය ම සම්බන්ධයෙන් සාදනු ලැබූ අවස්ථාවක, එම ප්‍රඥප්තියට අනුමැතිය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බලපවත්වන තාක් කල් පමණක්, එම පළාත ඇතුළත එම නීතියේ විධිවිධාන ක්‍රියාත්මකවීම අත්හිටුවනු ලැබ තිබිය යුතු අතර ඒ විධිවිධාන අක්‍රියව පැවැතිය යුත්තේ ය.

(9) සමගාමී ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මෙම පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව එම නීතියට අනනුකූල ප්‍රඥප්තියක් එම කාරණයම සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලැබූ අවස්ථාවක, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් පටහැනි තීරණයක් ගනු ලැබුවහොත් මිස, එම ප්‍රඥප්තියට අනුමතය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බලපවත්වන තාක් කල් පමණක් එම පළාත් ඇතුළත එම නීතියේ විධිවිධාන අත්හිටුවනු ලැබිය යුතු අතර ඒ විධිවිධාන අක්‍රියව පැවතිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව යම් කාරණයක් සම්බන්ධයෙන් මුළු ශ්‍රී ලංකාවම හෝ එහි යම් කොටසක් සඳහා නීති සෑදීමට (මේ පරිච්ඡේදය ඇතුළු) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරී ඇති බලතල හීනකරන්නාක් සේ කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුත්තේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වී තිබුණ ද පාර්ලිමේන්තුව විසින්, පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් වෙනත් යම් රටක් හෝ රටවල් සමඟ ඇති කර ගත් යම් ගිවිසුමක්, එකඟවීමක් හෝ සම්මුතියක් හෝ ක්‍රියාත්මක කිරීමේ හෝ ජාත්‍යන්තර සම්මේලනයක දී, සංගමයක දී හෝ වෙනත් මණ්ඩලයක දී එළඹෙන ලද යම් තීරණ ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්යය සඳහා, එම අනුව්‍යවස්ථාවේ දක්වා ඇති කාර්ය පටිපාටිය නොවන වෙනත් ආකාරයකින් නීති සෑදිය හැක්කේ ය.

අනුමතය.

154උ. (1) පළාත් සභාවක් විසින් සාදන ලද යම් ප්‍රඥප්තියකට මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට අනුමතය ලැබුණු විට, එම ප්‍රඥප්තිය බලාත්මක වන්නේ ය.

(2) පළාත් සභාවක් විසින් සාදන ලද සෑම ප්‍රඥප්තියක්ම එම ප්‍රඥප්තිය සාදන ලද වහාම, අනුමතය සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත්කරනු ලැබිය යුතු ය. එවිට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය දීම හෝ එම ප්‍රඥප්තිය තමාගේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු හැකි තරම් ඉක්මණින්, එම ප්‍රඥප්තිය හෝ එහි යම් නිශ්චිත විධිවිධානයක් නැවත සලකා බලන ලෙස සභාවෙන් ඉල්ලා සිටින සහ විශේෂයෙන්, පණිවුඩයේ නිර්දේශ කරනු ලබන සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාව සලකා බලන ලෙස ඉල්ලා සිටින පණිවුඩයක් සමඟ පළාත් සභාව වෙත ආපසු යැවීම හෝ කළ යුත්තේ ය.

(3) ආණ්ඩුකාරවරයා විසින් (2) වන අනුව්‍යවස්ථාව යටතේ පළාත් සභාවක් වෙත ප්‍රඥප්තියක් ආපසු එවනු ලැබූ අවස්ථාවක, පළාත් සභාව විසින් ආණ්ඩුකාරවරයාගේ පණිවුඩය කෙරෙහි සැලකිල්ල ඇතිව ප්‍රඥප්තිය නැවත සලකා බැලිය යුතු අතර සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ හැකිය.

(4) ප්‍රඥප්තියක් (2) වන අනුව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත්කරනු ලැබූ විට, ආණ්ඩුකාරවරයා විසින් එයට අනුමතය දීම හෝ එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල නොවන බවට තීරණයක් ලබා ගැනීමට එම ප්‍රඥප්තිය දෙවන වරට සම්මත කරනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කිරීම සඳහා රඳවා තබාගැනීම හෝ කළ හැක්කේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක, එම අධිකරණ තීන්දුව තමාට ලැබුණු විට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය දිය යුත්තේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනනුකූල යයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක, ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය නොදිය යුත්තේ ය.

154එ. (1) අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට තර්ජනයක් එල්ල වී තිබීමේ හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ලවී තිබීමේ හේතුව මත මහජන ආරක්ෂක ආඥාපනතේ හෝ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිවල විධිවිධාන ක්‍රියාත්මක කරන ප්‍රකාශනයක් ඒ ආඥාපනතේ හෝ නීති හෝ යටතේ කරනු ලැබූ විට, යම් ආණ්ඩුකාරවරයෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු විධායක බලය ක්‍රියාත්මක කළ යුතු වන ආකාරය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ඒ ආණ්ඩුකාරවරයාට විධාන නිකුත් කළ හැක්කේ ය. එම විධාන එම ප්‍රකාශනය කිරීම සඳහා හේතු වශයෙන් එහි දක්වා ඇති හේතුවලට අදාළ විය යුත්තේ ය. මහජන ආරක්ෂාව.

පැහැදිලි කිරීම :-

අත්‍යවශ්‍ය සැපයුම් සේවා පවත්වාගෙන යාමට තර්ජනයක් එල්ල වී ඇති බව හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් නිසා ශ්‍රී ලංකාවේ හෝ එහි දේශයේ යම් කොටසක ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී ඇති බව ප්‍රකාශ ප්‍රකාශ කරමින් මහජන ආරක්ෂක අඥාපනත යටතේ ප්‍රකාශනයක්, ඒ අන්තරායය අත්‍යාසන්න බවට ජනාධිපතිවරයා සෑහීමට පත්වේ නම් ඒ සේවා සැපයුම් ඇත්ත වශයෙන්ම ඇණහිටීමට හෝ ඒ යුද්ධය හෝ ආක්‍රමණය හෝ කැරැල්ල ඇත්ත වශයෙන් ඇතිවීමට පළමුව ජනාධිපතිවරයා විසින් කළ හැක්කේ ය :

එසේ වුව ද, එවැනි යම් ප්‍රකාශනයක් ශ්‍රී ලංකාවේ යම් කොටසක පමණක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක මේ ව්‍යවස්ථාව යටතේ විධාන නිකුත් කිරීමට ජනාධිපතිවරයා සතු බලය අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වා ගැනීම හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ස්ථිර කිරීම සඳහා යෝග්‍ය වේ නම් සහ එසේ යෝග්‍ය වනතාක් දුරට, එම ප්‍රකාශනය ක්‍රියාත්මකව පවතින පළාත නොවන වෙනත් පළාතකට ද ව්‍යාප්ත විය යුත්තේ ය.

(2) මහජන ආරක්ෂක ආඥාපනත හෝ මහජන ආරක්ෂාවට අදාළව තත් කාලයේ හෝ බලපවත්නා නීතිය යටතේ හෝ කරන ලද ප්‍රකාශනයක් සියලුම කාර්ය සඳහා තීරණාත්මක විය යුතු අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. තවද එම ප්‍රකාශනය පිළිබඳව හෝ ප්‍රකාශනය කිරීමේ හේතු පිළිබඳව හෝ එම හේතු පවතින්නේ ද යන්න පිළිබඳව හෝ මේ ව්‍යවස්ථාව යටතේ දෙන ලද යම් විධානයක් පිළිබඳව හෝ කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් විභාග කිරීම, මතයක් ප්‍රකාශ කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය.

විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම.

154ජ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ පරිච්ඡේදය යටතේ ආණ්ඩුකාරවරයාට හෝ යම් පළාත් සභාවකට දෙන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීම ආණ්ඩුකාරවරයා හෝ ඒ පළාත් සභාව විසින් පැහැර හැර ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ඒ පළාතේ පරිපාලනය කරගෙන යා නොහැකි තත්වයක් උද්ගත වී ඇතැයි ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

පරිපාලනය ඇනහිටීම.

154ඣ. (1) යම් පළාතක පරිපාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කරගෙන යා නොහැකි බවට එම පළාතේ ආණ්ඩුකාරවරයාගෙන් ලැබුණු වාර්තාවක් අනුව හෝ අන්‍යාකාරයකින් හෝ ජනාධිපතිවරයා සෑහීම ට පත්වුවහොත් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින්—

(අ) පළාතේ පරිපාලනය සතු සියලුම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් හෝ ආණ්ඩුකාරවරයා වෙත හෝ පළාත් සභාව නොවන එම පළාතේ වෙනත් යම් මණ්ඩලයක් හෝ අධිකාරියක් වෙත පැවරී ඇති හෝ ඔහු හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ තමන් වෙත පවරාගත හැක්කේ ය.

(ආ) පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුව විසින් හෝ එහි බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කළ හැක්කේ ය.

(ඇ) ප්‍රකාශනයේ පරමාර්ථ සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය ලෙස හෝ උචිත ලෙස ජනාධිපතිවරයාට පෙනී යන ආකාරයේ අනුෂාංගික විධිවිධාන සැලැස්විය හැක්කේ ය.

එසේ වුව ද, යම් අධිකරණයකට පැවරී ඇති හෝ යම් අධිකරණයක් විසින් ක්‍රියාත්මක කළ හැකි කිසිම බලයක් ජනාධිපතිවරයා වෙත පවරා ගැනීම පිණිස මේ අනුව්‍යවස්ථාවේ කිසිවකින් බලය නොලැබෙන්නේ ය.

(2) ඊට පසුව කරනු ලබන ප්‍රකාශනයක් මගින් එවැනි යම් ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැක්කේ ය.

(3) මේ ව්‍යවස්ථාව යටතේ වූ සෑම ප්‍රකාශනයක් ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශනය ඊට කලින් වූ ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ ප්‍රකාශනයක් වන අවස්ථාවක හැර, දින දහ හතරක් වූ කාලසීමාවක් ඉකුත් වීමට පෙර එය පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබීණි නම් මිස, එහි බලපෑම දින දහහතරක කාලය ඉකුත් වූ විට අවසන් වන්නේ ය:

එසේ වුවද, (කලින් වූ ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ ප්‍රකාශනයක් නොවන) එවැනි ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන අවස්ථාවක කරනු ලැබුවහොත් හෝ මේ අනුව්‍යවස්ථාවේ සඳහන් දින දහහතරක කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් සහ එම කාලසීමාව ඉකුත්වීමට පෙර එම ප්‍රකාශනය සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් පාර්ලිමේතුව විසින් සම්මතකර නොමැති නම්, පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින දහහතරක කාලසීමාවක් ඉකුත්වීමට පෙර එම ප්‍රකාශනය අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත් මිස, එහි බලපෑම පාර්ලිමේන්තුව එසේ රැස්වූ දිනයේ සිට දින දහ හතරක් ඉකුත් වූ විට අවසන් වන්නේ ය.

(4) එසේ අනුමත කරන ලද ප්‍රකාශනයක්, එය කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කරන ලද දිනයේ සිට මාස දෙකක කාලයක් ඉකුත් වූ විට එහි බලපෑම අවසාන විය යුත්තේ ය:

එසේ වුවද, එම ප්‍රකාශනය දිගටම බලපවත්නා පිණිස අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කළහොත් සහ එසේ සම්මතකරන සෑම වාරයකදීම, ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස, එම ප්‍රකාශනයේ බලපෑම මේ අනුව්‍යවස්ථාව යටතේ අවසාන විය යුතු දිනයේ සිට වැඩිදුර මාස දෙකක කාලසීමාවක් දිගටම බලපැවැත්විය යුතු ය. එහෙත් කිසිම අවස්ථාවක ඒ ප්‍රකාශනය එක් අවුරුද්දකට වැඩි කාලයක් බලාත්මක නොවිය යුත්තේ ය.

එසේම තවදුරටත්, එවැනි යම් මාස දෙකක කාලසීමාවක් ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ නමුත් එකී කාලසීමාව ඇතුළත එම ප්‍රකාශනය දිගටම බලපවත්වන පිණිස යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ නොමැති අවස්ථාවක, පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින දහ හතරක් ඉකුත්වීමට පෙර, ඒ ප්‍රකාශනය දිගටම බලපවත්වන පිණිස පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් විසින් සම්මත කරනු ලැබුවහොත් මිස ඒ ප්‍රකාශනයේ බලපෑම එකී දින දහ හතරක වූ කාලසීමාව ඉකුත් වීමේ දී අවසාන වන්නේ ය.

(5) මෙම ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වී තිබුණ ද (1) වන අනුව්‍යවස්ථාව යටතේ තමා විසින් ප්‍රකාශනයක් කිරීමෙන් දින දහ හතරක් ඇතුළත සහ එම අනුව්‍යවස්ථාවේ සඳහන් කාරණා අතුරින් කිසිවක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වීම සඳහා ජනාධිපතිවරයා විසින් එම කාරණා සම්බන්ධයෙන් දින හැටක කාලසීමාවක් ඇතුළත විභාගකර වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කළ හැක්කේ ය. එසේ පත්කරන ලද විනිශ්චකාරවරයෙකුට, එම පරීක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයෙකු සතු බලතල ඇත්තේ ය. ඒ විනිශ්චයකාරවරයාගේ වාර්ථාව ලැබුණ විට, (1) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනය ජනාධිපතිවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැක්කේ ය.

(6) මෙම ව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනයක් සියලු කාර්යය සඳහා තීරණාත්මක විය යුතු අතර ඒ ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. තව ද කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් එම ප්‍රකාශනය හෝ එය නිකුත් කිරීමට හේතු පිළිබඳව හෝ විභාග කිරීම හෝ ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ඒ ගැන ප්‍රශ්න කිරීම හෝ නොකළ යුත්තේ ය.

පළාත් සභාවක බලතල පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට පැවරීම.

154ඕ. (1) පළාත් සභාවක බලතල පාර්ලිමේන්තුව විසින් හෝ පාර්ලිමේන්තුවේ බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව 154ඹ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයකින් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක–

(අ) ප්‍රඥප්ති සම්පාදනය කිරීමට පළාත් සභාවට ඇති බලය පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට පැවරීම සහ එසේ පවරන ලද බලය සුදුසු යයි ජනාධිපතිවරයා අදහස් කරන කොන්දේසිවලට යටත්ව තත් කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් අධිකාරයකට පවරා දීමට පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට බලයදීම ;

(ආ) පාර්ලිමේන්තුවේ සභාවාර නොපවත්නා කාලයක් තුළ දී පළාතේ පළාත් සභා අරමුදලින් දරනු ලබන වියදම් සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය අපේක්ෂාවෙන් ජනාධිපතිවරයා විසින් ඒ වියදම් සඳහා බලයදීම

නීත්‍යානුකූල වන්නේ ය.

(2) 154ඹ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක් බලපවත්වන අතරතුර දී පාර්ලිමේන්තුව විසින් හෝ ජනාධිපතිවරයා විසින් හෝ (1) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් වෙනත් අධිකරණයක් විසින් සාදන ලද ප්‍රඥප්තියක්, එම පළාත් සභාව විසින් සංශෝධනය කරනු ලබන තුරු හෝ ඉවත් කරනු ලබනතුරු දිගටම බලපැවැත්විය යුත්තේ ය.

**154ක.** (1) ශ්‍රී ලංකාවේ හෝ එහි දේශයේ යම් කොටසක මූල්‍ය ස්ථායීභාවයට හෝ මූල්‍ය කීර්තියට තර්ජනයක් වන අවස්ථාවක් පැන නැගී ඇති බවට ජනාධිපතිවරයා සෑහීමට පත්වුවහොත්, ඔහු විසින් ප්‍රකාශයක් මගින් ඒ බවට වූ ප්‍රකාශයක් කළ හැක්කේ ය. මූල්‍ය ස්ථායීභාවය.

(2) (1) වන අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක් –

(අ) ඊට පසුව කරන ලද ප්‍රකාශනයක් මගින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැක්කේ ය ;

(ආ) පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුත්තේ ය ;

(ඇ) මාස දෙකක කාලසීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබුවහොත් මිස, එකී මාස දෙකක් ව කාලසීමාව ඉකුත්වීමේ දී බලාත්මක වීම අවසන් වන්නේ ය :

එසේ වුව ද, ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන කාලයක කරනු ලැබුවහොත් හෝ (ඇ) ඡේදයේ සඳහන් මාස දෙකක කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුව විසිරුවා හරිනු ලැබූ නමුත් එම කාලසීමාව ඉකුත්වීමට පෙර එම ප්‍රකාශනය සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු නොලැබුවහොත් පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින තිහක් වූ කාල සීමාවක් ඉකුත් වීමට පෙර එම ප්‍රකාශනය අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත් මිස, එකී දවස් තිහක් වූ කාලසීමාව ඉකුත් වූ විට, එකී ප්‍රකාශනයේ බලපෑම අවසන් වන්නේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාව සඳහන් කර ඇති යම් ප්‍රකාශනයක් ක්‍රියාත්මකව පවතින කාලසීමාව ඇතුළත, විධානවල සඳහන් කරනු ලැබෙන අන්දමේ තිසි මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරන ලෙසට ද තත් කාර්යය සඳහා ප්‍රමාණවත් යයි ජනාධිපතිවරයා විසින් අදහස් කරනු ලබන වෙනත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද යම් පළාතක ආණ්ඩුකාරවරයකුට ජනාධිපතිවරයා විසින් විධාන නිකුත් කළ හැක්කේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද එවැනි යම් විධානයකට –

(අ) පළාතක කටයුතු සම්බන්ධයෙන් සේවයේ යෙදී සිටින සියලුම තැනැත්තන්ගේ හෝ යම් පන්තියකට අයත් තැනැත්තන්ගේ වැටුප් සහ දීමනා අඩු කිරීමට නියම කෙරෙන විධිවිධානයක් ද ;

(ආ) පළාත් සභා අරමුදලකට හෝ එම අරමුදලෙන් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වෙන සියලු ප්‍රඥප්ති පළාත් සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් පසුව, ඒ ප්‍රඥප්ති ජනාධිපතිවරයා විසින් සළකා බැලීම සඳහා වෙන් කර තැබිය යුතු බව නියම කෙරෙන විධිවිධානයක් ද ;

ඇතුළත් විය හැක්කේ ය.

මහාධිකරණය.

**154ග.** (1) මේ පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, එක් එක් පළාතට මහාධිකරණයක් තිබිය යුතු ය. ඒ එක් එක් මහාධිකරණය අදාළ පළාතේ මහාධිකරණය ලෙස නම් කරනු ලැබිය යුත්තේ ය.

(2) අග්‍රවිනිශ්චයකාරවරයා විසින් ඒ එක් එක් මහාධිකරණයට අවශ්‍ය විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවක්, ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් අතුරෙන් නම් කළ යුත්තේ ය. ඒ සෑම විනිශ්චයකාරවරයකුම අග්‍රවිනිශ්චයකාරවරයා විසින් මාරු කරනු ලැබිය හැක්කේ ය.

(3) (අ) පළාත් ඇතුළත සිදු කරන වරදවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ මුල් අපරාධ අධිකරණ බලය නීතියට අනුව ක්‍රියාත්මක කිරීම;

(ආ) 138 වන ව්‍යවස්ථාවේ කුමක් සඳහන් ව තිබුණ ද, යම් නීතියකට යටත්ව, එම පළාත ඇතුළත මහෙස්ත්‍රාත් අධිකරණ සහ ප්‍රාථමික අධිකරණය විසින් කරන ලද වරදකරු කිරීම්, දණ්ඩන නියමයන් සහ ආඥාවන් සම්බන්ධයෙන් අභියාචන සහ ප්‍රතිශෝධන අධිකරණය බලය ක්‍රියාත්මක කිරීම ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් නීති මගින් විධිවිධාන සලස්වනු ලබන ආකාරයේ වෙනත් අධිකරණ බලය සහ බලතල ක්‍රියාත්මක කිරීම ;

ඒ සෑම මහාධිකරණයක් විසින් ම කළ යුත්තේ ය.

(4) එකී සෑම මහාධිකරණයකට ම, නීතියට අනුව –

(අ) පළාත ඇතුළත නීතිවිරෝධී ලෙස රඳවා තබාගෙන ඇති යම් තැනැත්තන් සම්බන්ධයෙන් හේබියස් කෝපුස් රිට් ආඥා ස්වභාවයේ වූ ආඥා; සහ

(ආ) පළාත ඇතුළත –

(i) යම් නීතියක් හෝ ;

(ii) එම පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් සාදන ලද ප්‍රඥප්තියක්;

යටතේ බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙකුට විරුද්ධව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමූස් සහ ක්වෝවොරන්ටෝ යන රිට් ආඥාවල ස්වභාවයේ වූ ආඥා පළාත්

සහා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නිකුත් කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

(5) පළාත ඇතුළත යම් මුල් අවස්ථා අධිකරණයක පරිපාලනය සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීමේ බලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් යම් මහාධිකරණයකට පැවරිය හැක්කේ ය.

(6) (3) (ආ) හෝ (ඇ) ඡේද හෝ (4) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ තම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ ලා එවැනි යම් අධිකරණයක් විසින් කරන ලද අවසාන ආඥාවකින්, නඩු තීන්දුවකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව ඊට විරුද්ධව 138 වන ව්‍යවස්ථාවට අනුකූලව අභියාචනාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැක්කේ ය.

**154ඡ.** පාර්ලිමේන්තුව විසින්, නීති මඟින් – පළාත් සභාවල කර්තව්‍ය, බලතල හා ඒවායේ මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම ආදිය.

(අ) පළාත් සභාවල මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සහ එම සභාවල සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ;

(ආ) ඒ සෑම සභාවක් ම විසින් කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඇ) පළාත් සභාවල මන්ත්‍රීවරුන් ගේ වැටුප් සහ දීමනා ; සහ

(ඈ) මේ පරිච්ඡේදයේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වෙනත් යම් කාරණයක් සහ මේ පරිච්ඡේදයේ විධිවිධානවලට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**154ජ.** (1) පහත සඳහන් අයගෙන් සමන්විත මුදල් කොමිෂන් සභාවක් විය යුත්තේ ය– මුදල් කොමිෂන් සභාව.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ;

(ආ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා ; සහ

(ඇ) එක් එක් තැනැත්තා මුල්‍ය, නීති පරිපාලන, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය ක්ෂේත්‍රවල කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ හෝ තැනැත්තන් විය යුතු ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කිරීම සඳහා වෙනත් සාමාජිකයන් තිදෙනෙක්.

(2) කලින් මිය ගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකු ම අවුරුදු තුනක කාලයකට ධූරය දරන්නේ ය.

(3) පළාතේ අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේ ය.

(4) (අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදදීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ; සහ

(ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමුකරන ලද වෙනත් යම් කාරණයක්

සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ ය.

(5) රට තුළ තුල්‍ය ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීම අරමුණු කර කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙල කළ යුතු අතර ඒ අනුව–

(අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව ;

(ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම ;

(ඇ) විවිධ පළාත් අතර ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව ; සහ

(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩිම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව

සැලකිල්ලට ගත යුත්තේ ය.

(6) කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් නීති මගින් කොමිෂන් සභාව වෙත පවරනු ලබන බලතල කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව සතු වන්නේ ය.

(7) මුල්‍ය කොමිෂන් සභාව විසින් මේ ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම නිර්දේශයක් ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, ඒ නිර්දේශ මත ගනු ලැබූ ක්‍රියා කවරේදැයි පාර්ලිමේන්තුවට දැනුම් දිය යුත්තේ ය.

(8) එවැනි අරමුදල්වල ප්‍රමාණවත් භාවයට හෝ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නිර්දේශයකට හෝ සකස් කරන ලද යම් ප්‍රතිපත්තියකට අදාළ යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හෝ කවර ආකාරයකින් වුව ද එවැන්නක් භාර ගැනීම, තීරණය කිරීම හෝ ඒ පිළිබඳව ආඥාවක් කිරීම කවර වුව ද අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් නොකළ යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන සහ නවවන උපලේඛන එකතු කිරීම.

7. මෙහි පහත දැක්වෙන උපලේඛන, හත්වන උපලේඛනයෙන් ඉක්බිතිව එකතු කරනු ලබන අතර, ඒවා පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන සහ නවවන උපලේඛන ලෙස බලපවත්වන්නේ ය.

අටවන උපලේඛනය (154අ ව්‍යවස්ථාව)

පළාත්

බස්නාහිර පළාත
වයඹ පළාත
ඌව පළාත
සබරගමුව පළාත
මධ්‍යම පළාත
නැගෙනහිර පළාත
දකුණු පළාත
උතුරු මැද පළාත
උතුරු පළාත

නවවන උපලේඛනය

1 වන ලැයිස්තුව

(පළාත් සභා ලැයිස්තුව)

1. පොලිසි සහ මහජන සාමය–
ජාතික ආරක්ෂාව සහ ජාතික සුරක්ෂිතභාවය ද යම් සන්නද්ධ හමුදා හෝ සිවිල් බලයට සහාය පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ පාලනය යටතේ වූ වෙනත් යම් හමුදා යොදා ගැනීම ද බැහැර කොට, සහ කොළඹ නගරය, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරය සහ ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මඟින් ජනාධිපතිවරයා විසින් සීමාවන් නිශ්චය කොට නියම කරනු ලබන ඒ නගරවල තදාසන්න ප්‍රදේශයන් අතහැර, පළමුවන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට පළාත ඇතුළත මහජන සාමය පැවැත්වීම සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම.

2. සැලසුම්–
පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම.

3. අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා–
III වන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට, අධ්‍යාපනය.

4. පළාත් පාලනය–

4 : 1 පළාත් පාලන ආයතනවල සංයුතිය, ස්වරූපය සහ ව්‍යුහය නීතියෙන් නියම කළ යුතුය යන ව්‍යතිරේකයට යටත්ව, පළාත් පාලන සහ ග්‍රාම පරිපාලන කාර්යය සඳහා මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන ආයතන ;

4 : 2 නීතියෙන් පිහිටුවනු ලබන පළාත් පාලන ආයතන (විසුරුවා හැරීමට හේතු පිළිබඳව යම් අර්ධ අධිකරණමය විභාගවලට සහ ඒ සම්බන්ධයෙන් වූ නීතිමය ප්‍රතිකර්මවලට සහ නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි විගණනයට අදාළ විධිවිධානවලට යටත්ව) විසුරුවා හැරීමේ බලය ද ඇතුළු වන ඒ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම ;

4 : 3 පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේ ය. මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ මහා නගර සභාවලට සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේ ය. පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට, පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභාවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරා දීම කළ හැක්කේ ය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම පළාත් සභාවක් විසින් කළ නොහැක්කේය;

4 : 4 පවත්නා නීතිය යටතේ ග්‍රාමෝදය මණ්ඩල වෙත පැවරී ඇති බලතල ග්‍රාමෝදය මණ්ඩලවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් ග්‍රාමෝදය මණ්ඩලවලට අතිරේක බලතල පවරා දීම කළ හැකි ය.

5. පළාත්වල නිවාස සහ ඉදිකිරීම්—

5 : 1 ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව (ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති නොවන) පළාත්බද නිවාස සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ පසුවිපරම් කිරීම.

5 : 2 කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ පනත සහ ගෙවල් කුලී පනත, පළාතක් ඇතුළත ක්‍රියාත්මක කිරීම.

5 : 3 මේ ලැයිස්තුවේ දක්වා ඇති විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු.

6. (අ) ජාතික මහා මාර්ග ;

(ආ) ජාතික මහා මාර්ගවල ඇති පාලම් සහ තොටුපළවල් හැර, පළාත ඇතුළත ඇති පාරවල්, පාලම් සහ තොටුපළවල්.

7. සමාජ සේවා සහ පුනරුත්ථාපනය —

7 : 1 පරිවාස හා ළමාරක්ෂක සේවා ;

7 : 2 අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය ;

7 : 3 කායික, මානසික සහ සාමාජික වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ ශුභ සාධනය ;

7 : 4 අබල සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම.

8. පළාත ඇතුළත මෝටර් වාහන මඟින් පාරවල් ඔස්සේ මඟීන් ගෙන යාමේ සේවා සහ භාණ්ඩ ගෙන යාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම.

9. කෘෂිකර්මය සහ ගොවිජන සේවා.

9 : 1 පළාත්බද කාර්ය සඳහා කෘෂිකාර්මික ව්‍යාපෘතිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය ද (අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම්වල පදිංචි කිරීමේ යෝජනා ක්‍රම රජයේ ඉඩම් හා වැවිලි කෘෂිකර්මය හැර) කෘෂිකාර්මික සේවා ද ඇතුළුව කෘෂිකර්මය ;

9 : 2 සුළු වාරිමාර්ග වැඩකටයුතු පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම ;

9 : 3 ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන ලෙස නාමෝද්දිෂ්ට ආයතන හැර කෘෂිකර්මික පර්යේෂණ.

10. ග්‍රාම සංවර්ධනය.

11. සෞඛ්‍යය—

11 : 1 (ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්ය සඳහා පිහිටුවනු ලබන රෝහල් හැර) මහජන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස සහ බෙහෙත්ශාලා පිහිටුවා පවත්වා ගෙන යාම ;

11 : 2 මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පවුල් සෞඛ්‍යය, මාතෘ දරක රක්ෂණය, ආහාර සහ ආහාර සෞඛ්‍යාරක්ෂණය, පාරිසරික සෞඛ්‍යය ;

11 : 3 පළාත සඳහා සෞඛ්‍ය වර්ධන සැලසුම සහ වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම ;

11 : 4 ඖෂධ ලබා දීම හැර, පළාත ඇතුළත ඉහත 1 හි සඳහන් සියලු ආයතන සඳහා පහසුකම් සැලසීම ;

11 : 5 ඉහත 1 හි සඳහන් ආයතනවලට අනුයුක්ත පිරිස්වලට ශ්‍රී ලංකාව ඇතුළත පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

12. දේශීය වෛද්‍ය කටයුතු – ආයුර්වේද, සිද්ධ සහ යුනානි.

12 : 1 ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, එවැනි බෙහෙත් ශාලා වලට හා රෝහල්වලට ආධාර මුදල් ;

12 : 2 ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම ;

13.

13 : 1 පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන තානායම් ; සහ

13 : 2 මේ ලැයිස්තුවෙහි යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල කර්තව්‍ය විශේෂයෙන් සඳහන් කොට ඇත්තේ ද ඒ දෙපාර්තමේන්තු විසින් දැනට පාලනය කරනු ලබන සංචාරක බංගලා.

14. බඩු උකස් ගන්නන්–

බැංකු විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාර හැර, බඩු උකස් ගන්නන්.

15. වෙළඳපොළවල්, පොළවල්.

16. පළාත් ඇතුළත ආහාර සැපයීම සහ බෙදාහැරීම.

17. සමුපකාර–

17 : 1 සමුපකාර ව්‍යාපාර සහ පළාත ඇතුළත සමුපකාර සමිති සංවිධානය, ලියාපදිංචිය, අධීක්ෂණය හා විගණනය ;

17 : 2 සමුපකාර අධ්‍යාපනය සහ ප්‍රචාරක කටයුතු ද ඇතුළුව, පළාත ඇතුළත සමුපකාර සංවර්ධනය ;

17 : 3 පළාත්බද සමුපකාර සේවා නියුක්තයන්ගේ කොමිෂන් සභාව ;

17 : 4 පළාත ඇතුළත සමුපකාර සමිතිවල සේවා නියුක්තයන් සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඒ සේවා නියුක්තයන් හා සම්බන්ධ වෙනත් කාරණා.

18. ඉඩම–

ඉඩම්, එනම් (II) වන පරිශිෂ්ටයෙහි දක්වා ඇති ප්‍රමාණයට ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් බුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම්වල පදිංචි කරවීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම.

19. වාරිමාර්ග

පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රම සම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම.

20. සත්ව පාලනය–
පළාත ඇතුළත පශු සම්පත් සංරක්ෂණය කිරීම, රැක ගැනීම සහ වැඩිදියුණු කිරීම හා සත්ව රෝග වැළැක්වීම.

21. සංවර්ධනය සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙළ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට යටත්ව, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යවසාය හා ව්‍යාපෘති කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය සංස්ථාවලට ඇති බලයට හානියක් නොමැතිව, පළාත ඇතුළත ප්‍රවර්ධනය කිරීමට පිහිටුවීමට හා ඒවායේ නිරතවීමට ඇති බලය (පළාත ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පළාත සඳහා කාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ඒ පිළිබඳ සම්බන්ධීකරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ)

22. චරිතශෝධනාගාර, බෝස්ටල් ආයතන සහ ඒ සමාන ස්වභාවයේ වෙනත් ආයතන හා ඒවායේ රඳවාගෙන සිටින තැනැත්තන්, එවැනි ආයතන ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වෙනත් පළාත් සමඟ වැඩපිළිවෙල.

23. මත් බීම සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම හා විකිණීම.

24. පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මඟින් හෝ නීතියක් යටතේ හෝ ජාතික අනුස්මරණ සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර, භූමදාන සහ භූමදාන බිම්, ආදාහන සහ ආදාහන බිම්.

25 : 1 පළාත් සභාවක් විසින් පාලනය කරන සහ මුදල් සපයන පුස්තකාල, කෞතුකාගාර සහ වෙනත් ඒ හා සමාන ආයතන ;

25 : 2 ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මඟින් හෝ නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පෞරාණික සහ ඓතිහාසික ස්මාරක සහ වාර්තා.

26. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් හෝ ඒ යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට පළාත ඇතුළත පතල් හා ඛනිජ සංවර්ධන විධිමත් කිරීම.

27. වෙළෙඳ සංස්ථා, බැංකු, රක්ෂණ සහ මූල්‍ය සංස්ථා හැර පළාතට සීමා වූ අරමුණු ඇති සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම සහ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම.

28. සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ, සාහිත්‍ය, විද්‍යා, ආගමික සහ වෙනත් සමිති හා සංගම් විධිමත් කිරීම.

29 : 1 ප්‍රදර්ශනය හා ප්‍රසිද්ධ රඟ දැක්වීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම හැර, රැඟුම්හල් සහ රඟදැක්වීම, සංගීතය, සිනමාහල්, ප්‍රසංග සහ විනෝද කටයුතු ;

29 : 2 ක්‍රීඩා දිරිගැන්වීම සහ වැඩිදියුණු කිරීම (ජාතික ක්‍රීඩා සංගම් හැර).

30. බලපත්‍ර ගාස්තු සහ බදු නියම කිරීම හැර ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා.

31. පළාත් ණය.

32. මේ ලැයිස්තුවෙහි සඳහන් කාරණා අතුරින් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්තිවලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි.

33. යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු හැර, මේ ලැයිස්තුවෙහි සඳහන් කවර **හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු.**

34. (ජාතික විදුලිබල පද්ධතිය පෝෂණය කිරීම සඳහා උත්පාදනය කරනු ලබන ජල විදුලි බලය හා බලය හැර) විදුලිබල ශක්ති උත්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත ඇතුළත වැඩ බිම් සහ පහසුකම් සංවර්ධනය කිරීම, සංරක්ෂණ කිරීම සහ පාලනය කිරීම.

35. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් හෝ නීතියක් යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට, මුදල් ණයට ගැනීම.

36 : 1 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියෙන් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, තොග සහ සිල්ලර විකිණීම් සම්බන්ධයෙන් පිරිවැටුම් බදු ;

36 : 2 ජාතික ලොතරැයි සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ලොතරැයි නොවන ලොතරැයි සහ තෑගි තරඟ බදු සහ ඔට්ටු බදු ;

36 : 3 බලපත්‍ර බදු, අරක්කු රා රේන්ද, මැදීම් බලපත්‍ර ගාස්තු, සහ මත්පැන් බලපත්‍ර ගාස්තු ;

36 : 4 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මඟින් නියම කරනු ලැබිය හැකි යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව මෝටර් වාහන බලපත්‍ර ගාස්තු ;

36 : 5 ඖෂධ සහ වෙනත් රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළඳ බලපත්‍ර බදු ;

36 : 6 ඉඩම් සහ මෝටර් රථ වැනි දේපළ පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ;

36 : 7 රේන්ද ගාස්තු එකතු කිරීම ;

36 : 8 අධිකරණ විසින් පනවනු ලබන දඩ ;

36 : 9 වෛද්‍ය ආඥාපනත යටතේ අයකරනු ලබන ගාස්තු ;

36 : 10 මෝටර් වාහන ගමනාගමන පනත යටතේ අයකරනු ලබන ගාස්තු ;

36 : 11 මෙම ලැයිස්තුවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගාස්තු ;

36 : 12 වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනත යටතේ ගාස්තු ;

36 : 13 ඉඩම් සංවර්ධන ආඥාපනත සහ රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් ගාස්තු ;

36 : 14 අධිකරණයේදී ඉදිරිපත් කෙරෙන ලේඛන සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ද ඇතුළු අධිකරණ ගාස්තු ;

36 : 15 පඩි සහ මිමි ආඥාපනත යටතේ නියමිත ගාස්තු ;

36 : 16 ආදායම් තක්සේරුව සහ එකතු කිරීම ඇතුළු ඉඩම් ආදායම සහ ආදායම් කාර්ය සඳහා ඉඩම් වාර්තා සමීක්ෂණය සහ පවත්වාගෙන යාම ;

36 : 17 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මඟින් අවසර දෙන ලද ප්‍රමාණයට රජයේ දේපළ ද ඇතුළු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් බදු ;

36 : 18 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මඟින් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, ඛනිජ අයිතිවාසිකම් සම්බන්ධයෙන් බදු ;

36 : 19 මත්ද්‍රව්‍ය සන්තකය, ප්‍රවාහනය, මිලට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු ;

36 : 20 පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් හෝ යටතේ අවසර දෙන ලද ප්‍රමාණයට පළාත්වල කාර්ය සඳහා ආදායම් ලබාගනු පිණිස පළාත ඇතුළත වෙනත් අයබදු ගැනීම ;

37. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් හෝ නීතියක් යටතේ අවසර දී ඇති ප්‍රමාණයට, පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම.

## පරිශිෂ්ටය I

## නීතිය හා යථා පැවැත්ම

1. විමධ්‍යගත කරනු ලබන විෂයය පහත දැක්වෙන ආකාරයට විස්තර කළ යුතුය :— මේ උපලේඛනයෙහි දක්වා ඇති පරිදි පළාත ඇතුළත මහජන සාමය සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම ; එහෙත් ඊට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් නොවිය යුතුය.

(අ) ජාතික ආරක්ෂාව ;
(ආ) ජාතික සුරක්ෂිතභාවය ; සහ
(ඇ) යම් සන්නද්ධ හමුදා හෝ සිවිල් බලතලවලට සහාය පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ ඇති වෙනත් යම් හමුදා යොදා ගැනීම.

2. පොලිස්පතිවරයා, ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ ප්‍රධානයා විය යුතු ය. ශ්‍රී ලංකා පොලිස් හමුදාව පහත දැක්වෙන අංශවලට බෙදිය යුතු ය :—

(අ) ජාතික අංශය (විශේෂ ඒකක ද ඇතුළුව) ; සහ
(ආ) එක් එක් පළාත සඳහා පළාත්බද අංශයක්,

2:1 ජාතික අංශය පොලිස්පතිවරයා, නියෝජ්‍ය පොලිස්පතිවරයන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයන්, සහකාර පොලිස් අධිකාරිවරයන් සහ ජාතික මට්ටමෙන් බඳවා ගනු ලබන වෙනත් නිල දරන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

2:2 ජාතික අංශයෙන් ද්වීතීයනය කරන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයන්ගෙන්, පොලිස් අධිකාරිවරයන්ගෙන් හා සහකාර පොලිස් අධිකාරිවරයන්ගෙන් ද පළාත් මට්ටමින් බඳවා ගන්නා ලද පළාත්බද සහකාර පොලිස් අධිකාරිවරයන්, ප්‍රධාන පරීක්ෂකවරයන්, පරීක්ෂක වරයන්, උප පරීක්ෂකවරයන්, සැරයන් සහ කොස්තාපල්වරයන් යන තැනැත්තන්ගෙන් ද පළාත්බද අංශය සමන්විත විය යුතු ය. පළාත්බද අංශයේ සාමාජිකයෝ ජාතික අංශයට උසස් කරනු ලැබීමට සුදුස්සෝ වෙති.

3. ජාතික අංශයට බඳවා ගැනීම සහ පළාත්බද අංශවල පොලිස් නිලධරයන් ජාතික අංශයට උසස් කිරීම, පහත දැක්වෙන සාමාජිකයන් තිදෙනාගෙන් සමන්විත පොලිස් කොමිෂන් සභාවක් විසින් කළ යුතු ය :—

(අ) පොලිස්පතිවරයා ;
(ආ) ජනාධිපතිවරයා විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තෙක් ; සහ
(ඇ) අග්‍රවිනිශ්චයකාරවරයාගේ නාමිකයෙක්.

3 : 1 යම් පළාත්බද අංශයක සේවය කරන යම් පොලිස් නිලධරයකු ජාතික අංශය උසස් කිරීමට පළමුව, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අදාළ පළාත්බද පොලිස් කොමිෂන් සභාවෙන් ඒ නිලධරයා පිළිබඳව රහස්‍ය වාර්තාවක් කැඳවිය යුතු අතර, ඒ නිලධරයා උසස් කළ යුතු ද නොයුතු ද යන වග නිශ්චය කිරීමේ දී ඒ වාර්තාවේ සඳහන් කාරණා සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

3 : 2 මෙහි පහත 41 වන ඡේදයට යටත්ව, පොලිස්පතිවරයා හැර, ජාතික අංශයේ සාමාජිකයන් උසස් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව වගකිව යුතු ය.

3 : 3 පළාත්බද අංශවලට ද්වීතීයනය කරනු ලැබූ ද, තමන්ට විරුද්ධව පළාත්බද පොලිස් කොමිෂන් සභාව විසින් විනය ක්‍රියා මාර්ග ගෙන ඇත්තා වූ ද නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචන කොමිෂන් සභාව විසින් විභාග කර නිශ්චය කරනු ලැබිය යුතුය.

3 : 4 කොමිෂන් සභාව විසින්, සියළුම අංශවල පොලිස් නිලධරයන් බඳවා ගැනීම සහ උසස් කිරීම සඳහා වූ ප්‍රමිති නියම කළ යුතු අතර, ඒ ප්‍රමිති සියළුම පළාත්බද අංශ සඳහා ඒකාකාර වූ ප්‍රමිති විය යුතු ය.

4. එක් එක් පළාත්බද අංශයට බඳවා ගැනීම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත පළාත්බද පොලිස් කොමිෂන් සභාවක් විසින් කළ යුතු ය.

(අ) පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ;

(ආ) ජනාධිපතිවරයා විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තෙක් ; සහ

(ඇ) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නාමිකයෙක්.

4 : 1 පළාත්බද පොලිස් කොමිෂන් සභාව, පළාත්බද අංශයේ නිලධාරින්ගේ මාරුකිරීම්, උසස් කිරීම් සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද, පළාත්බද අංශයට ද්විතීයනය කරන ලද ජාතික අංශයේ නිලධරයන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ තනතුර තෙක් උසස් කිරීම සම්බන්ධයෙන් ද, නියෝජ්‍ය පොලිස්පතිවරයා හැර පළාත්බද අංශයට ද්වීතීයනය කරන ලද නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද වගකිව යුතු ය ;

එසේ වුව ද යම් පළාත්බද අංශයකට ද්විතීයනය කරනු ලැබූ ද, පළාත්බද පොලිස් කොමිෂන් සභාවක් විසින් තමන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගනු ලැබ ඇත්තා වූ ද ජාතික අංශයේ යම් නිලධරයකුට, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිවාසිකම් ඇති අතර අභියාචනා සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

5. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් හෝ පළාත්බද කොමිෂන් සභාවක් විසින් හෝ ස්වකීය බලතල අතුරින් නියම කරනු ලැබිය හැකි යම් බලතල නියම කරනු ලැබිය හැක්කේ වෙනත් තැනැත්තකුට හෝ අධිකාරියකට පැවරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට හෝ පළාත්බද කොමිෂන් සභාවට හෝ හිමිකම් තිබිය යුතුය.

6. එක් එක් පළාත් සඳහා ඒ ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟතාවය ඇති පොලිස්පතිවරයා විසින් නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කළ යුතු ය. පොලිස්පතිවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා අතර එකඟතාවයක් නොමැති අවස්ථාවක ඒ කාරණය ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ප්‍රධාන අමාත්‍යවරයාගෙන් නිසි විමසීම් කිරීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් ඒ පත්වීම කරනු ලැබිය යුතුය.

7. ජාතික අංශයේ සියළුම නිලවල පොලිස් නිලධාරි සේවක සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නියම කළ යුතු ය. එක් එක් පළාත්බද අංශයේ නිලධරයන්ගේ සහ වෙනත් නිලවල සේවක සංඛ්‍යාව—

(අ) පළාතේ වර්ග ප්‍රමාණය ;

(ආ) පළාතේ ජනගහනය ; සහ

(ඇ) එකඟවනු ලබන හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් උපමාන කෙරෙහි සැලකිලිමත්ව පළාත්බද පරිපාලනය විසින් ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව නියම කරනු ලැබිය යුතු ය.

මේ මූලධර්ම සියලු පළාත්බද අංශ කෙරෙහි ඒකාකාරී ලෙස අදාළ විය යුතු ය.

7 : 1 ජනගහනය වර්ග ප්‍රමාණය, පොලිස් ස්ථාන සංඛ්‍යාව, යනාදිය සහ වෙනත් අදාළ කරුණු කෙරෙහි සැලකිලිමත්ව, නිර්ණය කරනු ලබන ප්‍රතිපත්ති මත, පළාත් බද අංශවල සේවක සංඛ්‍යාව නිශ්චය කළ යුතු ය. මේ ප්‍රතිපත්ති සියලුම පළාත්බද අංශ කෙරෙහි වෙනසක් නොමැතිව අදාළ විය යුතු ය.

7 : 2 ජාතික සහ පළාත්බද අංශවල විවිධ නිලවල නිලධාරීන් භුක්ති විදින වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක ලාභ පළාත්වල ප්‍රධාන අමාත්‍යවරයන් විමසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. පළාත්බද අංශවල සාමාජකයන් විසින් භුක්ති විදිනු ලබන වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක ලාභ සියළුම පළාත්බද අංශ කෙරෙහි ඒකාකාර ලෙස අදාළ විය යුතු ය.

8. ජාතික අංශය සඳහා වූ ගිනි අවි වෙඩි ද්‍රව්‍ය සහ අනිකුත් උපකරණවල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. සියලුම පළාත්බද අංශ සඳහා වූ ගිනි අවි හා වෙඩි ද්‍රව්‍ය සහ අනිකුත් උපකරණ වල ස්වභාවය, වර්ගය හා ප්‍රමාණය පළාත්බද පොලිස් කොමිෂන් සභාව විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර සියලුම පළාත්බද අංශ සඳහා ඒකාකාර ප්‍රමිති හා ප්‍රතිපත්ති අදාළ විය යුතු ය.

9. ජාතික අංශයට බඳවා ගැනීම පොලිස් කොස්තාපල්, උප පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් නිල සඳහා විය යුතු ය. පළාත්බද අංශයට බඳවා ගැනීම පොලිස් කොස්තාපල්, උප පොලිස් පරීක්ෂක සහ (ඉහත 2.2 ඡේදයේ සඳහන් නිලය වන) පළාත්බද සහකාර පොලිස් අධිකාරි නිල සඳහා විය යුතු ය.

9:1 ජාතික අංශයට බඳවා ගැනීම, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ද, පළාත්බද අංශයට බඳවා ගැනීම පළාත්බද පොලිස් කොමිෂන් සභාව විසින් ද, තත් කාර්යය සඳහා නියමිත බඳවා ගැනීමේ ප්‍රමිති හා උපමාන කෙරෙහි සැළකිලිමත් ව කළ යුතු ය. එසේ වුව ද බඳවා ගත් තැනැත්තකු පත් කරනු ලැබීමේ දී ඔහු සේවය කිරීමට කැමති අංශය පිළිබඳ මනාපය දක්විය යුතු අතර, හැකිනම් ඔහු සේවය කිරීමට කැමති අංශයට, ඒ අංශයේ කැමැත්ත ඇතිව කරනු ලැබිය යුතු ය.

9:2 ශ්‍රී ලංකා පොලිස් හමුදවේ සියලු අංශවලට බඳවාගනු ලබන තැනැත්තන් හා ඒවායේ සාමාජිකයන් පුහුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වගකිව යුතුය.

10. ජාතික අංශයේ සහ පළාත්බද අංශවල සාමාජිකයන් එක ම නිල ඇඳුම් සහ නිල ලාංඡනය පැළඳිය යුතු ය. එසේ වුව ද එක් එක් අංශයේ සාමාජිකයන්ගේ නිල ඇඳුම්වල ඔහු අයත් වන අංශය පෙන්නුම් කරන විශේෂ උරහිස් ලකුණක් විය යුතු ය.

10 : 1 එක් එක් පළාත සඳහා පළාත්බද අංශයේ සාමාජිකයන්ගෙන් සහ ඊට ද්විතීයනය කරන ලද නිලධරයන්ගෙන් සමන්විත නිල ඇඳුම් සහිත එක් පොලිස් හමුදාවක් විය යුතු ය. ජාතික අංශයේ සාමාජිකයන් සාමාන්‍යයෙන් සාමාන්‍ය ඇඳුමින් සැරසී සිටිය යුතු ය. එසේ වුව ද 12.2, 12.3 සහ 12.4 වන ඡේදවල දක්වා ඇති මහජන සාමය පවත්වාගෙන යාම හෝ නැවත ඇති කිරීම හා සම්බන්ධ යම් කාර්ය ඉටුකරන විට ඔවුන්ට නිල ඇඳුම්වලින් සැරසී සිටිය හැකි ය. තවද පොලිස්පතිවරයා හා නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයන් සාමාන්‍යයෙන් නිල ඇඳුම්වලින් සැරසී සිටිය යුතු ය.

11. යම් පළාතක ජාතික අංශයේ ඒකකවල සහ පළාත්බද අංශවල සේවය කරන සියලුම පොලිස් නිලධරයන් ඒ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ විධානය හා පාලනය යටතේ කටයුතු කළ යුතු ය.

11 : 1 පළාතේ මහජන සාමය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සහ මේ උපලේඛනයේ දක්වා ඇති පරිදි පළාතේ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා එම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාට වගකිවයුතු අතර ඔහුගේ පාලනය යටතේ සිටිය යුතු ය.

11 : 2 ඉහත 11 : 1 ඡේදයේ විධිවිධාන පහත දක්වෙන සීමාකිරීම්වලට යටත් විය යුතු ය :—

(අ) පළාතේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, පළාත ඇතුළත මහජන සාමය සම්බන්ධව ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ පළාත්බද පරිපාලනයේ බලතල සහ වගකීම් අතුරින් ජනාධිපතිවරයා විසින් නියෝග මගින් සලස්වන විධිවිධාන වල නියම කරනු ලැබිය හැකි යම් බලතල සහ වගකීම් ජනාධිපතිවරයා විසින් තමා වෙත පවරා ගනු ලැබිය හැකි ය ;

(ආ) බරපතල අභ්‍යන්තර කැළඹීම් නිසා පළාතක ආරක්ෂාවට හෝ මහජන සාමයට තර්ජනයක් එල්ල වී ඇති බව ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකර, එහෙත් ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසීමෙන් සහ මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, නියමයක් මගින්, මහජන සාමය නැවත ඇති කිරීමේ කාර්යය සඳහා ජාතික අංශයේ යම් ඒකකයක් සිවිල් බලතලවලට ආධාර පිණිස යොදා ගනු ලැබිය හැකි ය :

එසේ වුවද මහජන සාමය නැවත පිහිටුවා ඇති බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වූ වහාම නැතහොත් නියමයේ දිනයේ සිට දින තිහක් ඉකුත් වූ විට යන මේ අවස්ථා දෙකකින් කලින් එළඹෙන අවස්ථාවේ දී, ඒ සෑම නියමයක් ම බලාත්මකවීම නතර විය යුතු ය.

12 : 1 පළාත ඇතුළත මහජන සාමය ආරක්ෂා කිරීම සහ (උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි හැර) සියලු වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම හා ඒ පිළිබඳව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාර නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, ඒ වැරදි පිළිබඳව අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද පළාත්බද අංශය වගකිව යුතු ය.

උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති සියලු වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ ඒ පිළිබඳව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාර නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, ඒ වැරදි පිළිබඳව අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ ජාතික අංශය වගකිව යුතු ය.

12 : 2 පළාතක් ඇතුළත මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයා ජාතික අංශයේ සහාය ඉල්ලා සිටින අවස්ථාවක, පොලිස්පතිවරයා විසින් ඒ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි ජාතික අංශයේ පිරිස් යොදවා ඒ පිරිස් පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පාලනය යටතට පත් කළ යුතු ය.

12 : 3 පළාත තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක්, ඒ පළාත තුළ මහජන සාමය නැවත ඇති කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පොලිස්පතිවරයා අදහස් කරන ජාතික අංශයේ යම් ඒකක ඔහු විසින් යොදවනු ලැබිය හැකි ය.

12 : 4 සාමාන්‍යයෙන් පළාත් බද අංශයක් විසින් විමර්ශනය කරනු ලැබිය හැකි යම් වරදක් පහත දැක්වෙන අවස්ථාවලදී අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ විමර්ශනය කරනු ලැබිය හැකි ය :—

(අ) අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ ඒ විමර්ශනය කළ යුතු බවට ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින අවස්ථාවක ; සහ

(ආ) ඒ වරද පිළිබඳ විමර්ශනයක්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ මහජන යහපත සඳහා වේ යයි පොලිස්පතිවරයාගේ මතය වන හා ඒ වරද අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ විමර්ශනය කළ යුතු බවට පොලිස්පතිවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයා විමසා සහ නීතිපතිවරයාගේ අනුමතය ඇතිව විධාන කරනු ලබන අවස්ථාවක.

13. පළාත්බද අංශයක් සතු වී ඇති සියලු කර්තව්‍ය ජාතික අංශය විසින් එක් අවුරුදු කාලයක් සඳහා හෝ ඒ පළාතේ පළාත් අංශයක් පිහිටුවනු ලබන තෙක් යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් යම් පළාතක් තුළ ඉටු කරනු ලැබිය යුතු ය.

14. ජාතික අංශයේ සහ පළාත්බද අංශවල සියලු රාජ්‍ය නිවේදිත නිලධරයන් සිංහල සහ දෙමළ භාෂාවලින් නියමිත ප්‍රවීණත්වය ලබාගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය. සහකාර පොලිස් අධිකාරී සහ ඊට ඉහළ නිලවල සියලුම නිලධරයන් ඉංග්‍රීසි භාෂාවෙන් නියමිත ප්‍රවීණත්වය ලබාගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා පොලිස් හමුදාවට බඳවා ගනු ලබන සෑම තැනැත්තකුටම ස්වකීය මව් භාෂාව පිළිබඳව ප්‍රවීණත්වයක් තිබිය යුතු ය. ඔහුගේ පළමුවන උසස්වීම සඳහා ඔහුගේ මව් භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණත්වයක් ඔහු විසින් ලබාගත යුතු ය. ඔහුගේ ඊළඟ උසස්වීම සඳහා තුන්වන භාෂාව පිළිබඳ දැනීමක් ඔහු විසින් ලබාගත යුතු ය. මේ කාර්යය සඳහා පිළිගත් භාෂා තුන වන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන් ය.

## උපලේඛනය

### ජාතික පොලීසිය විසින් විමර්ශනය කළ යුතු වරදවල් පිළිබඳ ලැයිස්තුව

1. රජයට විරුද්ධව කරනු ලබන වරදවල්.
2. නාවුක හමුදාවට, යුද හමුදාවට සහ ගුවන් හමුදාවට අදාළව කරනු ලබන වරදවල්.
3. ඡන්ද විමසීම්වලට අදාළව කරනු ලබන වරදවල්.
4. කාසිවලට, මුදල්වලට, නෝට්ටුවලට, සහ ආණ්ඩුවේ මුද්දරවලට අදාළව කරනු ලබන යම් වරදක්.

5. ජනාධිපතිවරයාට විරුද්ධව කරනු ලබන යම් වරදක්.

6. රජයේ නිලධරයකුට හෝ අධිකරණ නිලධරයකුට, හෝ කථානායකවරයාට හෝ අග්‍රාමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයකුට හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හෝ පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට හෝ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ විරුද්ධව කරනු ලබන යම් වරදක්.

7. රජයට අයත් දේපළවලට හෝ රජය විසින් ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලැබ ඇති රාජ්‍ය සංස්ථාවකට, හෝ සමාගමකට හෝ ආයතනයකට අයත් දේපළවලට අදළ යම් වරදක්.

8. ජාතික ආරක්ෂාවට හානිකර හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට හානිකර වන යම් වරදක්.

9. සංවෘත ලැයිස්තුවේ ඇතුළත් යම් කාරණයකට අදළව යම් නීතියක් යටතේ වූ වරදවල් අතුරෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් ජනාධිපතිවරයා විසින් බැහැර කරනු ලබන වරදවල් හැර එකී සෙසු වරදවල්.

10. පළාත් එකකට වැඩි සංඛ්‍යාවක අධිකරණවලට යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති විටක, ඒ වරද.

11. ජාත්‍යන්තර වරදවල්.

## පරිශිෂ්ටය II

## ඉඩම් සහ ඉඩම්වල පදිංචිකරවීම

රජයේ ඉඩම් ජනරජය සතුව දිගටම පැවතිය යුතු අතර 33(ඇ) ව්‍යවස්ථාව අනුව හා එම කාරණය පාලනය කෙරෙන ලිඛිත නීතියට අනුව එම ඉඩම් බැහැර කළ හැකිය.

ඉහත කී ආකාරයට යටත්ව ඉඩම් පිළිබඳ විෂයය, පහත දක්වෙන විශේෂ විධිවිධානවලට යටත්ව, පළාත් සභා විෂයයන් විය යුතු ය.

1. රජයේ ඉඩම් –

1.1 සංවෘත හෝ සමගාමී විෂයයක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ කාර්ය සඳහා අවශ්‍ය රජයේ ඉඩම්, ආණ්ඩුව විසින් එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය. එම ඉඩම් එම විෂයය සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව ආණ්ඩුව විසින් අදළ පළාත් සභාව විමසිය යුතු ය.

1.2 සෑම පළාත් සභාවකටම පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වී ඇති, එම පළාත ඇතුළත ඇති, රජයේ ඉඩම් ආණ්ඩුව විසින් ලබා දිය යුතු ය. පළාත් සභාව විසින් එම රජයේ ඉඩම්, එම කාරණය පාලනය කෙරෙන නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම කළ යුතු ය.

1.3 පළාතක් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියකුට හෝ සංවිධානයකට පවරාදීම හෝ නියාදනය කිරීම, අදළ පළාත් සභාවේ උපදේශය මත එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව, ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතු ය.

2. අන්තර් පළාත් වාරිමාර්ග කටයුතු සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති,

2.1 ඒ ව්‍යාපෘති –

(අ) රජය විසින් පළාත ඇතුළත ආරම්භ කරනු ලැබුවා වූ ද, පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලායන ගංගාවල ජලය යොදගනු ලබන්නා වූ ද, වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය;

එසේ වුවද පළාත් සභාවක් විසින් ඒ ගංගාවල ජලය යොදා ගනිමින් ඒ පළාත ඇතුළත වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය ද ආරම්භ කරනු ලැබිය හැකි ය.

(ආ) පළාතෙන් පිටත සිට හරවන ලද ජලය යොදා ගනු ලබන සහ පළාත් ඇතුළත වූ වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය.

(ඇ) මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය වැනි පාලන ප්‍රදේශය පළාත් දෙකකට හෝ වැඩි ගණනකට අයත්වන, සියලු යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය.

2.2 මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව සතුවිය යුතු ය.

2.3 මේ ව්‍යාපෘති නිසා, ඇතිවන කෘෂිකාර්මික ඉඩම්වල සහ නිවසස්ථාන ඉඩම් දුරිය හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්ති සහ උපමාන පළාත් සභා විමසා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

2.4 එම ඉඩම් කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම, පිළිවෙල, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් නොමැතිකමේ ප්‍රමාණය, ඔවුන්ගේ ආදයම් තත්ත්වය, පවුලේ සංඛ්‍යාව, කෘෂිකාර්මික පසුබිම ආදිය ඇතුලු පදිංචිකරුවන් තෝරා ගැනීමේ උපමාන කෙරෙහි සැලකිලිමත්ව නිශ්චය කරනු ලැබිය යුතු ය. මේ ප්‍රතිපත්ති නියම වශයෙන් අදළ කර ගැනීම, කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම සහ ඒ හා සම්බන්ධ වෙනත් ආනුෂංගික කාරණා පළාත් සභාවල බලතලවලට ඇතුළත් විය යුතු ය.

2.5 ඒ ව්‍යාපෘතිවල ඒ ඉඩම් කොටස් බෙදදීම ජාතික ජනවාර්ගික අනුපාතය අනුව විය යුතු ය. ඒ අනුපාතවලට අනුකූලව ඉඩම් කොටස් බෙදදීමේ දී, ඒ ව්‍යාපෘතිය නිසා උන්හිටි තැන් අහිමි වූ සහ ඒ ව්‍යාපෘතිය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් නොමැති තැනැත්තන්ට ද, ඉන් පසුව ඒ පළාතේ ඉඩම් නොමැති තැනැත්තන්ට ද, ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

2.6 එවැනි යම් ව්‍යාපෘතියකින් තමන්ට හිමි ඉඩම් කොටස් යම් ජනසමූහයක සාමාජිකයන් විසින් ලබා නොගන්නා හෝ ඔවුන්ට ඒ කොටස් ලබාගත නොහැකි වන අවස්ථාවක, ඔවුන්ට ඒ හා සමාන ඉඩම් කොටස් ගණනක් වෙනත් අන්තර් පළාත් වාරිමාර්ග හෝ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමයකින් ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය. මේ පාවිච්චි නොකරන ලද ප්‍රමාණය, දෙන ලද කාලරාමුවක් ඇතුළත් ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.

2.7 ඉහත කී ප්‍රතිපත්තිවලට අනුකූලව ඒ ව්‍යාපෘතිවල ඉඩම් කොටස් බෙදදීම හැකිතාක් දුරට ඒ පළාතේ ජනවිකාශන රටාව සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් නොවන පරිදි ද, මනුෂ්‍ය ජනාවාසවල ප්‍රජාවේ ඒකාග්‍රතාව සහතික කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ද සිදු කළ යුතු ය.

2.8 ඒ ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු ය.

. ජාතික ඉඩම් කොමිෂන් සභාව

3.1 ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්, ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටවිය යුතු අතර කොමිෂන් සභාව රජයේ ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳව වගකිව යුතු ය. මේ කොමිෂන් සභාවට දිවයිනේ සියලුම පළාත් සභාවල නියෝජිතයන් ඇතුළත් විය යුතු ය.

3.2 ජාතික ඉඩම් කොමිෂන් සභාවට, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදළ සමාජ-ආර්ථික සාධක මෙන්ම භෞතික සාධක අගැයීම් සඳහා අවශ්‍ය, අදළ සියලු විෂයයන් නියෝජනය වන තාක්ෂණික ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය.

3.3 ඉඩම් පාවිච්චිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (දේශපාලනික හෝ ජනවාර්ගික වශයෙන් නොව) කාර්මික සාධක මත පදනම් විය යුතු අතර, කොමිෂන් සභාව විසින් පස, දේශගුණය, වර්ෂාපතනය, පස සේදීයාම, වන ආවරණය, පාරිසරික සාධක, ආර්ථික යෝග්‍යතාව ආදී කරුණු කෙරෙහි සැලකිලිමත්ව ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පොදු න්‍යාය නියම කළ යුතු ය.

3.4 පළාත් සභා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, ඒ පළාත් සභා විසින් ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය කෙරෙහි නිසි පරිදි සැලකිලිමත්ව ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

## පරිශිෂ්ටය III

### අධ්‍යාපනය

1. නිශ්චිත පාසල් නොවන සියලුම රජයේ පාසල් සඳහා පහසුකම් සැලසීම (නිශ්චිත පාසල් නම්, ජාතික පාසල්, හමුදාවල සාමාජිකයන් සඳහා වූ විශේෂ පාසල් සහ නිශ්චිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා වූ පාසල් වේ.)

2. පහත දැක්වෙන පාසල් අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම-

(අ) සියලුම පෙර පාසල් ; සහ

(ආ) ඉහත දක්වා ඇති නිශ්චිත පාසල් නොවන සියලුම රජයේ පාසල්

(ප්‍රමිති පවත්නා බවට වගබලා ගැනීම පිණිස පාසල්වල කළමනාකරණය පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රඳවාගනු ලබන්නේ ය.)

3. සියලුම අධ්‍යාපන සේවා පිරිස් එනම්, ගුරුවරු, විදුහල්පතිවරු සහ අධ්‍යාපන නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය, ජාතික සේවයට අයත් එහෙත් පළාත්බද අධිකාරියට ද්විතීයනය කිරීම මත සේවය කරන නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම ඇත්තේ ය. සේවයෙන් පහකිරීමට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිය පළාත්බද සේවාවට අයත් නිලධරයන්ට ඇත්තේ ය.

4. අධ්‍යාපන විද්‍යායතනවලින් සහ විශ්ව විද්‍යාලවලින් දෙන ලද්ද වූ ද ඉගැන්වීමේ සුදුසුකම් වශයෙන් පිළිගෙන ඇත්තා වූ ද ඩිප්ලෝමා සහ උපාධි ඇති තැනැත්තන් ගුරු සේවයට බඳවා ගැනීම.

5. මේ වර්ගවලට ප්‍රමාණවත් පුද්ගලයන් සංඛ්‍යාවක් බඳවා ගතහැකි වනතෙක් ගුරුසේවයට වෙනත් තැනැත්තන් බඳවා ගැනීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන බඳවා ගැනීමේ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව සිදු කරනු ලබන්නේ ය. මේ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව පළාත්බද අධිකාරිවල සහභාගිත්වයෙන් සම්මුඛ පරීක්ෂණ හා තෝරා ගැනීමේ පරීක්ෂණය පවත්වනු ලබන්නේ ය.

6. 1ඒ, බී.සී. වර්ගවල පාසල් හැර අනෙක් සියලු පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම. (මෙහි ලා අනුගමනය කළයුතු තෝරා ගැනීමේ උපමාන අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබේ.)

7. 1ඒ බී.සී. පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ කරනු ලබන්නේ ය.

8. ගුරුවරුන් සහ වෙනත් අධ්‍යාපන සේවා පිරිස් පුහුණු කිරීම, ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය පථයට අයත් වේ. පළාත්බද අධිකාර විසින් ස්වකීය අවශ්‍යතා ජාතික අධ්‍යාපන ආයතනයට දැන්විය යුතු ය.

9. උපදේශක කර්තව්‍ය භාර පළාත්බද අධ්‍යාපන මණ්ඩල පත් කිරීම, අධ්‍යාපන අමාත්‍යවරයාගේ වගකීම වන්නේ ය. එහෙත් මෙය පළාත්බද අධිකාරියේ ප්‍රධාන අමාත්‍යවරයා ගේ එකඟත්වය ඇතිව කරනු ලැබේ.

10. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන නියමයන්ට අනුකූලවන පාසල් මණ්ඩල, පළාත්බද අධිකාර විසින් පිහිටුවනු ලැබේ.

11. පාසල් මණ්ඩලවල ක්‍රියාකාරිත්වය පළාත්බද අධිකාර විසින් අධීක්ෂණය කරනු ලැබේ.

12. සැලසුම් (අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම) පිළියෙළ කිරීම පළාත්බද අධිකාරියේ වගකීම වේ.

13. වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

14. විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අධ්‍යාපන නිලධරයන් කළ වැඩ පිළිබඳ අගැයීම.

15. ජාතික අධ්‍යාපන ආයතනයේ පූර්ව අනුමතය ලබා ගෙන ඇති සේවාස්ථ පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වා ගෙන යාම.

16. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ප්‍රාදේශීය විභාග පැවැත්වීම.

17. අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

18. පෙර පාසල් ලියාපදිංචි කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම.

19. ප්‍රාථමික පාසල්වල විෂය මාලාවේ සහ ද්විතීයික අධ්‍යාපනය පිළිබඳ තෝරාගත් විෂයවල ප්‍රාදේශීය වෙනස්කම් ඇති කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමතය ලබා ගැනීම.

20. අධ්‍යාපන ගොඩනැගිලි, පුස්තකාල සහ ක්‍රීඩා භූමි ඉදිකිරීම සහ නඩත්තු කිරීම.

21. ඉගැන්වීමේ ආධාර, දෘශ්‍යාධාර සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ, ලී බඩු සහ වෙනත් උපකරණ සැපයීම සහ බෙදා හැරීම.

22. අමාත්‍යාංශය විසින් සඳහන් කරන නිශ්චිත උපකරණ සමහරක් හැර, විද්‍යා උපකරණ ලබා ගැනීම සහ බෙදා හැරීම.

23. අමාත්‍යාංශයේ අනුමතය ලබා ගැනීමෙන් පසු පාසල් පොත් නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම.

24. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරනු ලබන මඟ පෙන්වීම්වලට අනුකූලව පාසල් පුස්තකාල සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම.

(ඉහතින් දක්වෙන්නේ දේශපාලන පක්ෂ සම්මේලනයේ 1වන කමිටුවේ නිර්දේශ අනුවය.)

## නවවන උපලේඛනය

## II වන ලැයිස්තුව

### (සංචෘත ලැයිස්තුව)

සියලු විෂයයන් සහ කර්තව්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය.

රාජ්‍ය ආරක්ෂාව සහ ජාතික සුරක්ෂිතභාවය, අභ්‍යන්තර ආරක්ෂාව, නීතිය හා යථා පැවැත්ම සහ 1වන ලැයිස්තුවේ අංක 1 දරන විෂයෙහි දක්වා ඇති ප්‍රමාණයට හැර අපරාධ වැළැක්වීම හා අනාවරණය කර ගැනීම.

මෙයට පහත දක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා සූදානම් වීම සහ යුද්ධමය අවස්ථාවක දී යුද්ධය පවත්වාගෙන යාම පිණිස හිතකර වන සියලු ක්‍රියා කිරීම සහ යුද්ධය අවසන් වූ පසුව සඵල ලෙස සේනා විසුරුවා හැරීම පිණිස හිතකර වන සියලු ක්‍රියා කිරීම ඇතුළුව, ශ්‍රී ලංකාවේ සහ එහි සෑම කොටසකම ආරක්ෂාව;

(ආ) නාවුක, යුද සහ ගුවන් හමුද, ශ්‍රී ලංකා ආණ්ඩුවේ වෙනත් කවර හෝ සන්නද්ධ හමුද ;

(ඇ) සිවිල් බලයට සහායවීම පිණිස, ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් සන්නද්ධ හමුදවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනයට යටත් වෙනත් යම් හමුදවක් හෝ ඒ හමුදවක යම් බල ඇණියක් හෝ ඒකකයක් යම් පළාතක යෙදවීම එසේ යොදවනු ලැබ සිටිය දී ඒ හමුදවල සාමාජිකයන්ගේ බලතල, ඒ බලතලවල විෂය පථය, වරප්‍රසාද සහ වගකීම ;

(ඈ) පාලන කොට්ඨාශවල සීමා නිර්ණය කිරීම, ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ස්වයං පාලනය ඒ පාලන කොට්ඨාස බලමණ්ඩල ඇතුළත ප්‍රදේශවල සංයුතිය සහ බලතල හා (ගෙවල් කුලී පාලනය ද ඇතුළුව) ඒ ප්‍රදේශවල නිවාස ඉඩ පහසුකම් විධිමත් කිරීම ;

(ඉ) නාවුක, යුද සහ ගුවන් හමුද කටයුතු ;

(ඊ) යුද්ධායුධ, ගිණි අවි, වෙඩි ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය ;

(උ) පරමාණු ශක්තිය සහ එය නිපදවීම සඳහා අවශ්‍ය ඛනිජ සම්පත් ;

(ඌ) ආරක්ෂක කාර්ය සඳහා හෝ යුද්ධයෙහි යෙදීම සඳහා හෝ අවශ්‍ය යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන කර්මාන්ත ;

(එ) අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව ;

(ඒ) රාජ්‍ය ආරක්ෂාව, විදේශ කටයුතු හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව හා සම්බන්ධ හේතු නිසා නිවාරක රැඳවීමෙහි තබා ගැනීම ; එසේ රඳවා තබා ගැනීමට යටත් තැනැත්තෝ ; සහ

(ඔ) යම් පළාතකට අයත් පොලිස් හමුදවක සාමාජිකයන් සතු බලතල හා ඒ බලතලවල විෂය පථය ඒ පළාතෙන් පිටත යම් ප්‍රදේශයකට ව්‍යාප්ත කිරීම. එහෙත් එසේ ව්‍යාප්ත කිරීම, ඒ ප්‍රදේශය පිහිටා ඇති පළාත් සභාවේ කැමැත්ත නොමැතිව එක් පළාතක පොලීසියකට ස්වකීය බලතල හා බලතලවල විෂය පථය, ඒ පළාතෙන් පිටත යම් ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කිරීමට හැකි නොවන පරිදි විය යුතු ය. යම් පළාතකට අයත් පොලිස් හමුදවක සාමාජිකයන් සතු බලතල හා ඒ බලතලවල විෂය පථය ඒ පළාතෙන් පිටත දුම්රිය ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම.

විදේශ කටයුතු

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) විදේශ කටයුතු ; ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනත් යම් විදේශ රටක් සමඟ සම්බන්ධතාවකට යොමු කරන සියලු කාරණා ;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික, කොන්සල් සහ වෙළඳ නියෝජනය ;

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානය ;

(ඈ) ජාත්‍යන්තර සම්මේලනවලට , සමිතිවලට සහ වෙනත් මණ්ඩලවලට සහභාගිවීම සහ ඒවායේ දී එළඹෙන තීරණ ක්‍රියාත්මක කිරීම ;

(ඉ) විදේශ රටවල් සමඟ සන්ධානවලට සහ ගිවිසුම්වලට ඇතුළත්වීම සහ විදේශ රටවල් සමඟ වූ සන්ධාන, ගිවිසුම් සහ සම්මුති ක්‍රියාත්මක කිරීම ;

(ඊ) යුද්ධය හා සාමය ; සහ

(උ) විදේශ අධිකරණ බලය

තැපැල් හා විදුලි සංදේශ, ගුවන් විදුලිය සහ රූපවාහිනී

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) තැපැල් හා විදුලි සංදේශ, දුරකථන, ගුවන් විදුලිය, විකාශන සහ වෙනත් එවැනි සන්නිවේදන මාධ්‍ය ; සහ

(ආ) ප්‍රදර්ශනය කිරීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම.

අධිකරණට සහ අධිකරණ පද්ධතියට අදාළ වනතාක් දුරට යුක්තිය පසිඳලීම.

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය, සංවිධානය, අධිකරණ බලය සහ (ඒ අධිකරණයට අපහාස කිරීම ද ඇතුළුව) එහි බලතල හා එහි දී අය කරනු ලබන ගාස්තු; ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය සහ වෙනත් අධිකරණ ඉදිරියෙහි වෘත්තියෙහි යෙදීමට හිමිකම් ලබන තැනැත්තෝ ;

(ආ) අභියාචනාධිකරණයේ සංයුතිය, සංවිධානය, අධිකරණ බලය සහ බලතල හා එහි දී අය කරනු ලබන ගාස්තු ; සහ

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හැර අනෙකුත් සියලු අධිකරණ වල අධිකරණ බලය සහ බලතල.

ජාතික ආදායමට, මූල්‍ය ප්‍රතිපත්තියට සහ විදේශ සම්පත්වලට අදාළ මුදල් පිළිබඳ කටයුතු : රේගුව

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ [illegible] ණය ;

(ආ) ව්‍යවහාර මුදල්, කාසි සහ වලංගු මුදල් ; විදේශ විනිමය ;

(ඇ) විදේශ ණය ;

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුව ;

(ඉ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව ;

(ඡ) ජාතික ලොතරැයි සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරනු ලබන ලොතරැයි ;

(ඪ) බැංකු කටයුතු ;

(ඪා) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් එවැනි සාධන පත්‍ර ;

(එ) රක්ෂණ කටයුතු ;

(ඒ) ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථාන සහ අනාගත භාණ්ඩ වෙළෙඳපොල ;

(ඔ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ පළාත් සභාවල ගිණුම් විගණනය ;

(ඕ) පුද්ගලයන්ගේ, සමාගම්වල සහ සංස්ථාවල ආදයම, ප්‍රාග්ධනය හා ධනය මත බදු ;

(ක) ආනයන සහ අපනයන බදු සහ සුරාබදු ඇතුළුව රේගු බදු ;

(ග) 1 වන ලැයිස්තුවේ නිශ්චිතව දක්වෙන ප්‍රමාණය හැර පිරිවැටුම් බදු සහ මුද්දර ගාස්තු ;

(ච) 1 වන ලැයිස්තුවේ නිශ්චිතව නොදක්වෙන වෙනත් යම් බද්දක් හෝ ගාස්තුවක් ;

**විදේශ වෙළෙඳාම, අන්තර් පළාත් අතර වෙළෙඳාම හා වාණිජ කටයුතු :**

මෙයට පහත දක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) විදේශ රටවල් සමඟ වෙළඳාම සහ වාණිජ කටයුතු, රේගු ප්‍රත්‍යන්ත හරහා ආනයනය සහ අපනයනය ; රේගු ප්‍රත්‍යන්ත පිළිබඳ අර්ථ කථනය ; සහ

(ආ) අන්තර් පළාත් වෙළඳාම හා වාණිජ කටයුතු.

**වරායවල් සහ නැව් තොටවල්**

මෙයට පහත දක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති හෝ පවත්නා නීති මගින් හෝ ඒ නීති යටතේ හෝ ප්‍රධාන වරායවල් ලෙස ප්‍රකාශයට පත් කරන වරායවල් සීමා නිර්ණය කිරීම ඇතුළුව, වරායවල් සහ ඒවායේ වරාය අධිකාරිවල සංයුතිය හා බලතල ;

(ආ) නිරෝධායනය හා සම්බන්ධ රෝහල් ද ඇතුළුව, වරාය නිරෝධායනය ; (නාවිකයන්ගේ රෝහල් සහ සාමුද්‍රිකයන්ගේ රෝහල්.)

**ගුවන් ගමනාගමනය සහ ගුවන් තොටුපළවල්**

මෙයට පහත දක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

ගුවන් සේවා ; ගුවන් යානා සහ ගුවන් තරණය ; ගගන යාත්‍රාංගන සැපයීම ගුවන් ගමනාගමනය සහ ගගන යාත්‍රාංගන විධිමත් කිරීම හා සංවිධානය කිරීම ; ගගන යාත්‍රික අධ්‍යාපනය සහ පුහුණුව සැලසීම සහ පළාත් මගින් සහ වෙනත් නියෝජ්‍යායතන මගින් සපයන එවැනි අධ්‍යාපනය සහ පුහුණුව විධිමත් කිරීම ;

ජාතික ප්‍රවාහනය

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) දුම්රිය සේවය ;

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතියක් මඟින් හෝ ඒ යටතේ හෝ ජාතික මහා මාර්ග බවට ප්‍රකාශයට පත් කරන ලද මහා මාර්ග ; සහ

(ඇ) දුම්රියෙන්, ගොඩින්, මුහුදින් හෝ ගුවනින් හෝ යන්ත්‍රානුසාරයෙන් ධාවනය වන යාත්‍රාවලින් ජාතික ජල මාර්ග ඔස්සේ හෝ මගීන් සහ භාණ්ඩ ගෙනයාම.

ගංගා සහ ජල මාර්ග ; නැව් ගමනාගමනය සහ මුහුදු තරණය, ඓතිහාසික ජලය, දේශීය ජල තීරය, අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටාකය සහ අභ්‍යන්තර ජලය ඇතුළුව සමුද්‍රීය කලාප ;1 වන ලැයිස්තුවේ 18 වන විෂයය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර රජයේ ඉඩම් සහ අක් වෙරළ.

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) මහ මුහුදේ දී හෝ ගුවනේ දී සිදු කරනු ලබන මුහුදු කොල්ලකෑම් හෝ ගුවන් කොල්ලකෑම් සහ අපරාධ ; ගොඩබිම දී හෝ මහ මුහුදේ දී හෝ ගුවනේ දී හෝ ජාත්‍යන්තර නීතියට විරුද්ධව සිදු කරනු ලබන වැරදි ;

(ආ) ජාතික ජලමාර්ග බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ජල මාර්ගවල යන්ත්‍රානුසාරයෙන් ධාවනය වන යාත්‍රාවලට අදාළව, නැව් ගමනාගමනය හා මුහුදු තරණය ; ඒ ජලමාර්ගවල මාර්ග නීති ;

(ඇ) බාදිය ජලතීරයේ නැව් ගමනාගමනය හා මුහුදු තරණය ඇතුළුව, සමුද්‍රීය නැව් ගමනාගමනය සහ මුහුදු තරණය ; වෙළඳ නාවිකයන් සඳහා අධ්‍යාපනය සහ පුහුණුව සැලසීම සහ පළාත් විසින් සහ වෙනත් නියෝජ්‍යායතන විසින් සලසනු ලබන එවැනි අධ්‍යාපනය සහ පුහුණුව විධිමත් කිරීම ;

(ඈ) නැව් ගමනාගමනයෙහි සහ ගුවන් යානාවල ආරක්ෂාව සඳහා ප්‍රදීප යාත්‍රා, ධාරාලෝක සහ වෙනත් විධිවිධාන ඇතුළුව ප්‍රදීපාගාර ;

(ඉ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ, අන්තර් පළාත් ගංගා සහ ගංගා නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම මහජන හිත පිණිස අවස්ථාචෝචිත යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණයට අන්තර් පළාත් ගංගා සහ ගංගා නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම ;

(ඊ) දේශීය ජලතීරයෙන් ඔබ්බෙහි මසුන් ඇල්ලීම හා ධීවර කටයුතු ; සහ

(උ) පළාතක් තුළ පිහිටා ඇති ශ්‍රී ලංකා ආණ්ඩුවේ දේපළ සම්බන්ධයෙන් වන විට, පාර්ලිමේන්තුව විසින් නීති මගින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වනතාක් දුරට හැර, ඒ පළාත විසින් සාදන ලද ප්‍රඥප්තිවලට යටත්ව ශ්‍රී ලංකා ආණ්ඩුවේ දේපළ සහ එයින් ලැබෙන ආදයම.

ඛනිජ ද්‍රව්‍ය හා පතල්

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :—

(අ) තෙල් බිම් සහ ඛනිජ තෙල් සම්පත් විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම; පෙට්‍රෝලියම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන; භයානක අන්දමින් ගිනිගන්නා සුළු යයි පාර්ලිමේන්තුව විසින් නීති මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන් වෙනත් ද්‍රව හා ද්‍රව්‍ය ; සහ

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ පතල් හා ඛනිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම මහජන හිත පිණිස වන්නේ යයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණයට, පතල් හා ඛනිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම.

ආගමනය හා විගමනය සහ පුරවැසිභාවය

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) පුරවැසිභාවය, පුරවැසිභාවයට ඇතුළත් කිරීම සහ විදේශිකයෝ ;

(ආ) උද්ර්පණය ; සහ

(ඇ) ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩදීම සහ විගමනය හා ශ්‍රී ලංකාවෙන් පිටමං කිරීම ; විදේශ ගමන් බලපත්‍ර හා වීසා බලපත්‍ර.

ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා සඳහා ඡන්ද විමසීම හා පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම ඇතුළුව, ඡන්ද විමසීම

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

පාර්ලිමේන්තුව සඳහා, පළාත් සභා සඳහා, පළාත් පාලන ආයතන සඳහා සහ ජනාධිපති ධුරය සඳහා ඡන්ද විමසීම් ; මැතිවරණ දෙපාර්තමේන්තුව.

ජනලේඛන සහ සංඛ්‍යාලේඛන

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) ජනලේඛන ; සහ

(ආ) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක කාර්යය සඳහා වූ විමර්ශන, සමීක්ෂණ සහ සංඛ්‍යාලේඛන.

වෘත්තීය රැකියා සහ පුහුණු කිරීම

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

(අ) ජාතික වැදගත්කමින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද විශ්වවිද්‍යාල වැනි ආයතන ;

(ආ) ජාතික වැදගත්කමකින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද විද්‍යාත්මක හෝ කාර්මික අධ්‍යාපනය සඳහා වන ආයතන ;

(ඇ) (i) පොලිස් නිලධරයන් පුහුණු කිරීම ද ඇතුළුව වෘත්තීය, ශිල්පීය හෝ කාර්මික පුහුණුව ; හෝ

(ii) විශේෂ අධ්‍යයන හෝ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ; හෝ

(iii) අපරාධ විමර්ශනය කිරීම හෝ අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාත්මක හෝ කාර්මික සහාය ;

සඳහා වන පළාත් නියෝජ්‍යායතන හා ආයතන ; සහ

(ඈ) උසස් අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා වන ආයතනවල සහ විද්‍යාත්මක හා කාර්මික ආයතනවල සම්බන්ධීකරණය සහ ප්‍රමිති නිශ්චය කිරීම.

ජාතික ලේඛනාගාරය ; ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා කටයුතු සහ භූමි හා පුරා වස්තු

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ :–

ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පෞරාණික සහ ඓතිහාසික ස්මාරක හා වාර්තා සහ පුරා විද්‍යාත්මක භූමි සහ නෂ්ටාවශේෂ.

පහත දැක්වෙන විෂයයන් ඇතුළුව 1 වන ලැයිස්තුවේ හෝ 111 වන ලැයිස්තුවේ නිශ්චය කොට දක්වා නොමැති සියලු විෂයයන් හා කර්තව්‍ය :

(අ) ශ්‍රී ලංකාවෙන් බැහැර ස්ථානවලට වන්දනා ගමන් ;

(ආ) බැංකු, රක්ෂණ සහ මූල්‍ය සංස්ථා ඇතුළුව එහෙත් සමුපකාර සමිති

අත්හැර ; වෙළෙඳ සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම ;

(ඈ) එක් පළාතකට සීමා නොවූ අරමුණු ඇති එහෙත් විශ්වවිද්‍යාල ඇතුළත් නොවන වෙළෙඳ හෝ වෙළෙඳ නොවන සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම ;

(ඇ) පේටන්ට් බලපත්‍ර, නව නිර්මාණ සහ මෝස්තර, ප්‍රකාශන අයිතිය, වෙළෙඳ ලකුණු සහ වෙළෙඳ බඩු ලකුණු ;

(ඉ) කිරුම් හා මිනුම් පිළිබඳ ප්‍රමිති නියම කිරීම ;

(ඊ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන හෝ එක් පළාතකින් තව පළාතකට ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා ප්‍රමිති නියම කිරීම ;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කිරීම ජාතියේ හිත පිණිස අවශ්‍යාවෝචිත යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද කර්මාන්ත ;

(ඌ) පතල්වල ශ්‍රමය සහ කම්කරුවන්ගේ ආරක්ෂාකාරීත්වය විධිමත් කිරීම ;

(එ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජ්‍යායතන විසින් ලුණු නිෂ්පාදනය කිරීම, සැපයීම හා බෙදහැරීම ; වෙනත් නියෝජ්‍යායතන විසින් කරන ලුණු නිෂ්පාදනය සැපයීම හා බෙදහැරීම විධිමත් කිරීම;

(ඒ) අපනයනය සඳහා අබිං වගා කිරීම, නිෂ්පාදනය කිරීම සහ විකිණීම ;

(ඔ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවා නියුක්තයන් හා සම්බන්ධව කාර්මික ආරාවුල්;

(ඕ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මුදල් සපයන ලද්ද වූ ද ජාතික වැදගත්කමකින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද කෞතුකාගාර සහ යුද්ධ ස්මාරක වැනි ආයතන ;

(ක) ශ්‍රී ලංකාව මැනීම ; ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක, උද්භිද විද්‍යාත්මක, සත්ව විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක සමීක්ෂණ ; කාලගුණ විද්‍යා සංවිධාන;

(ග) ජාතික රාජ්‍ය සේවා ; ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව ;

(ච) විශ්‍රාම වැටුප්, එනම්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙවිය යුතු හෝ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ;

(ජ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ සහ නියෝජ්‍ය කථානායකවරයාගේ වේතන ;

(ට) පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ කාරක සභාවල බලතල වරප්‍රසාද හා පරිහාර, සාක්ෂි දීම හෝ ලියවිලි ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු කාරක සභා හෝ පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද කොමිෂන් සභා ඉදිරියෙහි පෙනී සිටින ලෙස තැනැත්තන්ට බලකිරීම;

(ඩ) ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුකාරවරයන්ගේ පඩිනඩි, දීමනා, වරප්‍රසාද සහ නිවාඩු පිට බැහැරව සිටීමේ අයිතාවාසිකම් ශ්‍රී ලංකා ආණ්ඩුවේ අමාත්‍යවරයන්ගේ වේතන හා දීමනා ; විගණකාධිපතිවරයාගේ වේතන, දීමනා සහ නිවාඩු හා සම්බන්ධ අයිතිවාසිකම් සහ වෙනත් සේවා කොන්දේසි;

(ණ) අන්තර් පළාත් සංක්‍රමණය ; අන්තර් පළාත් නිරෝධායනය ;

(ත) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ නීතිවලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි ; සහ

(ද) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු, එහෙත් යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු බැහැර කොට,

## III වන ලැයිස්තුව
## (සමගාමී ලැයිස්තුව)

1. සැලසුම් කිරීම–

1 : 1 පළාත් බද මට්ටමේ දී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම ඇති කිරීම සහ අගැයීම ;
1 : 2 ප්‍රගති පාලනය ;
1 : 3 රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයෝජන වැඩ සටහන්වල ප්‍රගතිය පසුවිපරම් කිරීම ;
1 : 4 ආර්ථික කටයුතුවල යෙදී සිටින ආයතනවල සහ ව්‍යවසායවල වැඩ කටයුතු අගැයීම ;
1 : 5 සැලසුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා අදාළ දත්ත ඉදිරිපත් කිරීම ;
1 : 6 සැලසුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා අදාළ තොරතුරු බෙදහැරීම;
1 : 7 ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන්වලට ප්‍රචාරයක් ලබාදීම ;
1 : 8 මිනිස් බල ක්‍රමසම්පාදනය සහ රැකියා දත්ත බැංකුව ;
1 : 9 පෝෂණ සැලසුම් සහ වැඩසටහන්

2 සහ 3 අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා–

1 වන ලැයිස්තුවේ අංක (3) සහ (4) විෂයවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර අධ්‍යාපනය.

4. උසස් අධ්‍යාපනය–
4 : 1 අලුත් විශ්වවිද්‍යාල පිහිටුවා පවත්වාගෙන යාම ;
4 : 2 1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යටතේ උපාධි ප්‍රදනය කරන ආයතන සහ තෘතියික, කාර්මික සහ ප්‍රාග්–විද්‍යාල අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වෙනත් ආයතන පිහිටුවීම.

5. ජාතික නිවාස සහ ඉදිකිරීම්–
නාගරික සංවර්ධන ප්‍රදේශවල ආර්ථික සමාජමය සහ භෞතික සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ ක්‍රම සැලසුම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීම.

6. දේපළ අත්කර ගැනීම සහ බලකර ලබාගැනීම.

7. සමාජ සේවා සහ පුනරුත්ථාපනය–
7 : 1 උත්හිටි තැන් අහිමි වූ තැනැත්තන්ට සහන සැලසීම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ නැවත පදිංචි කරවීම ;

7 : 2 ගංවතුර, නියඟ, වසංගත හෝ වෙනත් අසාමාන්‍ය හේතු නිසා ඇති වූ ආපදවල දී සහන සැලසීම සහ ඒවායින් හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ නැවත පදිංචි කරවීම ;

7 : 3 විනාශ වූ හෝ අලාභහානියට පත් නගර, ගම්, රජයේ ආයතන සහ දේපළ, කර්මාන්ත, ව්‍යාපාරික ස්ථාන, පූජනීය ස්ථාන සහ වෙනත් දේපළ ප්‍රතිසංස්කරණය කිරීම, යළි ගොඩනැංවීම සහ පුනරුත්ථාපනය කිරීම ; පාඩු හෝ අලාභහානි ලැබූ තැනැත්තන්ට හෝ ආයතනවලට වන්දි හෝ සහන ප්‍රදනය කිරීම සහ සිවිල් ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම.

8. කෘෂිකර්මය සහ ගොවිජන සේවා—

8 : 1 කෘෂිකර්මයට සම්බන්ධ කර්මාන්ත පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම ; ගොවිපලවල් පිහිටුවීම සහ නඩත්තු කිරීම සහ පෞද්ගලික තවාන් අධීක්ෂණය කිරීම ;
8 : 2 පස සංරක්ෂණය ;
8 : 3 ශාක පලිබෝධක.

9. සෞඛ්‍යය—

9 : 1 උපකාරක වෛද්‍ය සේවා පිරිස් පුහුණු කිරීම සඳහා පාසල් ;
9 : 2 පළාතක් ඇතුළත පුද්ගලික වෛද්‍ය පහසුකම් අධීක්ෂණය කිරීම. සාත්තු නිවාස සහ රෝග නිශ්චය කිරීමේ පහසුකම් පාලනය කිරීම ;
9 : 3 ජනගහනය පාලනය සහ පවුල් සංවිධානය ;
9 : 4 පළාත්බද වෛද්‍ය මණ්ඩල සංස්ථාපනය කිරීම ;

10. උප්පැන්න, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීම.

11. නගර සහ ගම් නැවත නම් කිරීම.

12. පළාත ඇතුළත පෞද්ගලික ලොතරැයි.

13. උත්සව සහ ප්‍රදර්ශන.

14. ආහාර සලාක කිරීම සහ ආහාර තොග පවත්වා ගැනීම.

15. සමුපකාර—සමුපකාර බැංකු.

16. සමීක්ෂණ—පළාත්බද හෝ සමගාමී ලැයිස්තුවේ දක්වා ඇති කාරණා අතුරින් කවර හෝ කාරණාගත කාර්ය සඳහා.

17. වාරිමාර්ග—

17 : 1 ජලය රැස්කර තැබීම සහ පාලනය කිරීම ජලාපවාහනය සහ වේලි, ගංවතුරින් ආරක්ෂාව, ජල සම්පත් සැලසුම් කිරීම ;
17 : 2 ග්‍රාම සංවර්ධනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, වෘත්තීය සහ කාර්මික පුහුණුව, සමුපකාර වැනි අන්තර් පළාත් ඉඩම් හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සලසනු ලබන සේවා සහ වෙනත් පහසුකම් ;

18. සමාජ වන විද්‍යාව සහ වනසතුන් සහ කුරුල්ලන් ආරක්ෂා කිරීම.

19. ධීවර කටයුතු—දේශීය ජල තීරයෙන් ඔබ්බෙහි මසුන් ඇල්ලීම හැර,

20. සත්ව පාලනය—

20 : 1 පශු සම්පත් සහ පශු නිෂ්පාදන නිපදවීම, සකස් කිරීම, බෙදාහැරීම, සහ විකිණීම ;
20 : 2 විද්‍යාගාරය සහ විද්‍යා උපකරණ සැපයීම ඇතුළුව පශු කටයුතු පුහුණු සේවා සහ පර්යේෂණ ;
20 : 3 සතුන් බෝ කිරීම, රැකබලා ගැනීම සහ සෞඛ්‍යය ;
20 : 4 තණ බිම් පිහිටුවීම ;

21. සේවා නියුක්තිය–
21 : 1 පළාත්බද මට්ටමේ දී සේවා නියුක්තිය සැලසුම් කිරීම ;
21 : 2 පළාතට අදාළ විශේෂ සේවා නියුක්ති වැඩසටහන් ;
21 : 3 පළාතට අදාළ යෞවන සේවා නියුක්ති කටයුතු ප්‍රවර්ධනය කිරීම ;
21 : 4 පළාතට අදාළ තාක්ෂණික මිනිස්බල සංවර්ධනය වැඩ පිළිවෙලවල්.

22. සංචාරක ව්‍යාපාර–
පළාතේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම.

23. පහත සඳහන් දේ පිළිබඳ වෙළඳාම හා වාණිජ්‍යය, නිෂ්පාදනය, සැපයීම සහ බෙදහැරීම–

(අ) යම් කර්මාන්තයක් මධ්‍යම ආණ්ඩුව විසින් පාලනය කිරීම මහජන යහපත සඳහා යෝග්‍ය වේ යයි පාර්ලිමේන්තුව විසින් නීති මඟින් ප්‍රකාශ කර ඇති අවස්ථාවක, ඒ කර්මාන්තයේ නිෂ්පාදිත සහ ඒ නිෂ්පාදිත වර්ගයේම වූ ආනයනය කළ බඩු ; සහ

(ආ) ආහාර ද්‍රව්‍ය සහ ගව ආහාර.

24. ප්‍රවෘත්ති පත්‍ර පොත් හා වාර සඟරා සහ මුද්‍රණාල.

25. මේ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති කාරණා කිසිවක් හා සම්බන්ධ ව්‍යවස්ථා වලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි.

26. යම් අධිකරණයක දී අය කරනු ලබන ගාස්තු හැර, මේ ලැයිස්තුවෙහි සඳහන් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් වූ ගාස්තු.

27. පුණ්‍ය කටයුතු සහ පුණ්‍යායතන, පුණ්‍ය සහ ආගමික ප්‍රදාන සහ ආගමික ආයතන.

28. මිල පාලනය.

29. මේ ලැයිස්තුවේ හෝ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක කාර්ය සඳහා පරීක්ෂණ සහ සංඛ්‍යා ලේඛන.

30. ආහාර ද්‍රව්‍ය සහ වෙනත් භාණ්ඩවල තත්ත්වය බාල කිරීම.

31. ඖෂධ සහ විෂ වර්ග.

32. පළාත ඇතුළත විදුලිය සැපයීම ව්‍යාප්ත කිරීම සහ පළාත ඇතුළත විදුලිබලය පාවිච්චි කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම.

33. පරිසරය ආරක්ෂා කිරීම.

34. ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරනු නොලැබ ඇති පුරා විද්‍යාත්මක භූමි සහ නටබුන්.

35. මනුෂ්‍යයන්ට, සතුන්ට හෝ ශාඛවලට බලපාන ආසාදක හෝ ස්පර්ශක රෝග හෝ පලිබෝධ එක් පළාතකින් තවත් පළාතකට පැතිරීයාම වැළැක්වීම.

36. වන්දනා ගමන්.